**2023.03.07 වන දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ හයවන සැසිවාරයේ**
**හැට වන මහා සභා රැස්වීමේ වාර්තාව.**

**සහභාගිවූවෝ**

| | |
|---|---|
| 01. එන්. සරත් සුමනසූරිය මැතිතුමා | ගරු සභාපති |
| 02.ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා | ගරු උප සභාපති |
| 03.ආර්.අර්.එම්.පී.රාජකරුණා මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04.එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05.එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06.එම්.ආර්.ධර්මකීර්ති ආරියරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07.කේ.ඒ.එස්.සී.ගුණතිලක මැතිනිය | ගරු මන්ත්‍රී |
| 08.කේ.ඒ.නිරෝෂණී පෙරේරා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 09.ඒ.පී.ධම්මික සුමනසිරි මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 10.එච්.ආර්.දයාරත්න වීරසූරිය මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 11.අයි.පී.අජිත් ගුණපාල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 12.පී.ජී.මංජු ශ්‍රී ජයශාන්ත මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 13.එම්.පී.සමීර ප්‍රියසාද් මුතුගල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 14.එන්.අකිල ප්‍රසාද් ජයරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 15.එම්.පී.සමන්මාලා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 16.ඩබ්.ඒ.මංජුල සරත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 17.ඒ.පී.රුවනි තරංගා විමර්ශනී මැතිනිය | ගරු මන්ත්‍රී |
| 18.එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 19.ඩී.ටී.කරුණාදාස ලෙනගල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 20.එච් සේනක ප්‍රියන්ත කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 21.ඩී.ජයසිංහ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 22.කේ.රංජිත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 23.එස්.ආර්.කේ.ලොකු ගලප්පත්ති මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 24.ජී.සනත් සේමසිරි වීරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 25.එස්.ඒ.ඉනෝකා ශ්‍යාමලී සමරවීර මැතිනිය | ගරු මන්ත්‍රී |
| 26.එල්.ආර්.ප්‍රියදර්ශනී අබේරත්න මැතිනිය | ගරු මන්ත්‍රී |
| 27.එල්.රංගනී ඉන්දු කුමාරි බණ්ඩාර මැතිනිය | ගරු මන්ත්‍රී |
| 28.ජී.ආර්.රේණුකා ගම්ලත් මැතිනිය | ගරු මන්ත්‍රී |
| 29.එච්.එම්.එන්.ජී.යූ.ගයානි හේරත් මැතිනිය | ගරු මන්ත්‍රී |
| 30.ආර්.ඩී.චන්ද්‍රා සෝමලතා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 31.කේ.ටී.ආනන්ද කරුණානායක මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 32.ජී.එල්.විජිත ගුණවර්ධන මැතිතුමා | ගරු මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන්**

| | |
|---|---|
| 01. ඩී.එම්.එම්.පී. දුනුසිංහ මිය | ලේකම් |
| 02. ඊ.එස්.අයි.වී. රොම්සන් මිය | විෂය නිළධාරී |

**අ- 01**
**2023.02.09 වන දින මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

**සභාගත කිරීම.**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**
**2023.02.09** වන දින මහා සභා රැස්වීම් වාර්තාව සභාගත කරනවා. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න අවස්ථාව.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා**
**2023.02.09** වන දින මහා සභා වාර්තාවේ සංශෝධන නොමැති නම් සභා සම්මත කිරීමට අවස්ථාව.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

***(ඒ අනුව 2023.02.09 වන දින මහා සභා රැස්වීම් වාර්තාව 2023.03.07 වන දින තීරණ අංක අ-01 යටතේ ඒකමතිකව සභා සම්මත විය)***

(ආ) ගරු සභාපතිතුමා විසින් කරන විශේෂ නිවේදන. – නැත

ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම් හා සංදේශ සභාගත කිරීම –

01.

වරකාපොල ප්‍රාදේශීය සභා මන්ත්‍රී දන්නොරුවලාගේ ජයසිංහ මහතා, ගරුමුනි සනත් සේමසිරි වීරරත්න මහතා, ෂෙල්ටන් රත්න කුමාර ලොකුගලප්පත්ති මහතා, කාලන්වියලාගේ රංජිත් කුමාර මහතා,ලේකම් රාලලාගේ ප්‍රියදර්ශනී අබේරත්න මහත්මිය යන අය සමගි ජන බලවේගය පක්ෂය නියෝජනය කරමින් 2023 පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා ලබා දීම මත එක්සත් ජාතික පක්ෂ සමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් කාර්යාලය විසින් එවා ඇති ලිපි මහා සභාවට ඉදිරිපත් කිරීම.

සභාව වෙත එවන ලද ලිපිය මේ එවලා තිබෙන්නේ. නමුත් මම මොනම කාරණයකට වත් මැතිවරණ කොමිෂන් සභාව විසින් මන්ත්‍රීධුරය අහෝසි කරන ලද ගැසට් පත්‍රය නිකුත් කරන තෙක් ගරු මන්ත්‍රීතුමන්ලාට තුමියන්ලාට මන්ත්‍රීධුරයේ හිමි වරප්‍රසාද මෙතෙක් කාලයක් හිමි වූ වරප්‍රසාද ඔබතුමන්ලාටත් හිමියි. මේ ලිපිය මා දැනුවත් කිරීම පිණිස එව්වා වුවත් මට අදාල වන්නේ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ගැසට් පත්‍රයයි. ගැසට් පත්‍රය මඟින් ඔබේ මන්ත්‍රීධුරය අහෝසි කරන ලද ලිපිය ලැබුණ පසු ඉදිරි කටයුතු කරමු. එතෙක් ඔබතුමන්ලාට හිමි සියලූම වරප්‍රසාද ඔබට හිමි වෙනවා.

(ඈ) කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඉ) කල් දී ඇති යෝජනා

**ඉ - 01**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

දියුණු කල ප්‍රදේශ ලෙස විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතියෙන් ගැසට් නිවේදනය කරන ලද වරිපනම් ඒකක 1891ක් පරිගනක මෘදුකාංගයට ඇතුලත් කිරීම සඳහාත්, එම දේපළ 1891 සඳහා විරෝධතා කැඳවීමේ K- form (කේ පෝරම) 2023 දෙවන කාර්තුවේ මුල සිට අය කිරීම සඳහා බෙදා දීමටත් අනුමැතිය ලබාදීම සුදුසු බවටත්,

GLG/LG/1/5/2018/14 අංක දරන 2018/12/13 දිනැති චක්‍රලේඛය අනුව එම දේපල 1891ක් පරිගනක මෘදුකාංගයට ඇතුලත් කිරීමේ ගාස්තු ලෙස එක් ඒකකයකට රු 2.00 බැගින්ද, K- form (කේ පෝරම) පරීක්ෂා කිරීම සඳහා එක් ඒකකයට රු.2.00 බැගින්ද, K- form (කේ පෝරම) බෙදීම සඳහා එක් ඒකකයකට රු.8.00 බැගින්ද ගෙවීම් කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.

තක්සේරු දෙපාර්තමේන්තුවේ සහයෝගය මත අපේ වරිපනම් ප්‍රදේශය පුළුල් කළා. ඒ අනුව වරිපනම් ඒකක 1891 දක්වා වැඩි වුණා. ඒ අනුව ඒකක වලට ඇතුලත් කරන්න ඕනේ. ඒ වෙනුවෙන් ගෙවන මුදල් ගෙවන්නත් ඕනේ. ඒක කරන්න තීන්දු කළේ දියුණු ගම් ප්‍රදේශ බවට පත් කල ප්‍රදේශ හඳුනා ගෙන ඒවා ගැසට් කළා. ඒ අනුව ඒකට අදාල ගෙවීම් ලබා දෙන්නටයි මෙම යෝජනාව ඇම්මේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 01 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 02**

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ ගරු සභාපති ආර්.ඇම්.ඒ.එන්. රණතුංග මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

**2023.02.21 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ පහත අංක 01 හා අංක 02 නිර්දේශ අනුමත කිරීමට මහ සභාවට යෝජනා කරමි.**

01.මෙම සභාවට අයත් ඇදිගම, නෙළුන්දෙණිය, අල්ගම සහ මායින්නොළුව යන ආයුර්වේද වල ඇති ඖෂධ තොග අවසන් වීමට ආසන්න බැවින් 2023 අයවැය ලේඛනයට අනුව 203(5) යටතේ රුපියල් 800000.00ක වියදමින් ඖෂධ ගෙන්වීමටත්, ඖෂධ තොග ලැබුණ පසු ආයුර්වේද සංස්ථාවට මුදල් ගෙවීම සුදුසු බවටත් යෝජනා කරමි.

02.කෑගලු දිස්ත්‍රික්කයේ සමාජ ඓතිහාසික තොරතුරු රැසක් අඩංගු කරමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රකාශයට පත් කරන ලද කෑගලු පුරාවත ශාස්ත්‍රීය ග්‍රන්ථය එකක් රුපියල් 2500.00 බැඟින් වරකාපොල, මායින්නොළුව, අල්ගම සහ ඇදිගම යන පුස්තකාල සඳහා ග්‍රන්ථ 04ක් රුපියල් 10000.00කට මිලදී ගෙන අදාල මුදල් කච්චේරි ශාඛාවේ සංස්කෘතික බල මණ්ඩලයේ ගිණුමට ගෙවීම සුදුසු බවට කමිටුව යෝජනා කරමි.

ගරු මන්ත්‍රී බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 02 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 03**

**පරිසර හා පොදු පහසුකම් කමිටුවේ ගරු සභාපති ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

**2023.02.21 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කමිටුවෙන් නිර්දේශිත වූ පහත කාරණා මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.**

01. ප්‍රධාන නගර සීමා තුළ සෑම මංසන්ධියකම ප්ලාස්ටික් බඳුන් එකතු කර පසුව ඒවා අලෙවි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

02. ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් මත වරකාපොල නගරය හා ගණිතපුර ප්‍රදේශය පවිත්‍ර කිරීම සඳහා ශ්‍රමදාන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා.**

ගරු සභාපතිතුමනි,අපි ප්ලාස්ටික් බඳුන් එකතු කරන්නට වැඩපිළිවෙළක් තමයි සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා එය තර්ක කරන්න දෙයක් නැහැ. ඔබ සියලු දෙනාම පරිසර හිතකාමීන් ලෙස ඒ වැඩපිළිවෙළ අපි ක්‍රියාත්මක කරමු කියන අදහස මම මෙයින් පෙන්වා දී තිබෙනවා. ඊට අමතරව ජනතාව ඉල්ලීමක් කරලා තිබෙනවා වරකාපොල හා ගණිතපුර ප්‍රදේශ වල කාණු පද්ධතිය අපවිත්‍ර වෙලා තිබෙනවා. ඒවා ශුද්ධ කරන්න තමයි මෙම යෝජනාව දැම්මේ.

**ගරු මන්ත්‍රී එම්.බී. මොහොමඩ් ෂරීප් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපට කොරෝනත් එක්ක පරිසර කමිටුවේ පොදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අපි යොමු වෙන්න බැරි වෙලා තිබෙන අවස්ථාවේදී, මම ස්තුතිවන්ත වෙනවා මෙම කාණු පද්ධතිය පිරිසිදු කරලා මාන ගස් ටික කපලා නගරය අවට ප්‍රදේශය වත් අඩුම තරමේ පිරිසිදුව තබා ගැනීමට හැකියාවක් ලැබීම පිළිබඳව.ඒත් එක්කම මම මතක් කරන්නට කැමතියි. ඉතිහාසයේ සුළු නගර සභා කාලයේ ඉදලා ඒ වැසිකිළිය අපි භාවිතයට නොගත්තත් අද ජනතාව අතර තිබෙනවා මේ වැසිකිලිය දැනට කැළෑ බිහි වෙලා තිබෙනවා. එය පිරිසිදු කර ගන්නට අවස්ථාව ලබා ගන්නට ඕනේ. මේ ශ්‍රමදානයත් එක්ක ඒකත් ඇතුලත් කරලා එම ශ්‍රමදාන වැඩසටහන ක්‍රියාත්මක කරනවා නම් වඩාත් හොඳයි කියලා හිතෙනවා. මෙම වැසිකිළිය භාවිතයට නොගත්තත් ජනතාවට පෙනෙන දෙයක් තමයි එය අපි සතු දේපළක් කියන එක. තවත් එකක් තමයි අපි අවුරුදු ගණනාවක් තිස්සේ ඉල්ලීමක් කළා, ගණිතපුර පන්දෙනිය පාරේ පුළුවන් කමක් තිබෙනවා නම්, ඒ පාරේ ටිකක් දුරට හරි ට්‍රැක්ටරයක් යවලා කුණු ටික එකතු කරන්න කටයුතු කරන්න. ජනතාවගේ මතය තමයි අපි වරිපනම් ගෙවන්නේ වීථි ලාම්පු දමන එක හා කුණු ටික එකතු කරන එකට තමයි වරිපනම් ගෙවන්නේ කියලා. ප්‍රාදේශීය සභාවක් ලෙස ලංකාවෙන්ම බදු පනත් වලට අනුකූලව බදු අය කර ගන්නේ පොදු සේවා කටයුතු සිදු කර ගන්නටයි. නමුත් ජනතාව අතරට යන්නේ එහෙම නෙවෙයි.මම දන්න දෙයක් තමයි බදු එකතු කරන්න නිළධාරීන් ගිය විට මිනිස්සු බනිනවා. ඊට පස්සේ කියනවා වරකාපොල ප්‍රාදේශීය සභාව මොනවද කළේ කියලා. ඒත් එක්කම අද අපහසුතාවයට පත් වෙලා තිබෙනවා ගරු සභාපතිතුමා. පසුගිය කාල සීමාවේදී වරකාපොල නගරයේ වීථි පහන් ටික අපි ස්නෝකල් එකක් ගෙනත් තමයි ඒවා දමන්න ඕනේ. සැහෙන වියදමක් යනවා. ජනතාව කියනවා නගරය අඳුරුයි කියලා. ළඟදී දවසක කඩ හොරුන් විසින් කඩලා තිබෙනවා. නොයෙක් නොයෙක් ආකාරයට ජනතාව මේ දෙස බලන්නේ.

ඔබතුමාට හැකියාව තිබෙනවා නම් ස්නෝකල් එකක් ගෙන්නලා ඒ වීථි ලාම්පු ටික සකස් කරන්න. නෙළුන්දෙණියේ සිට හැලගල ගල දක්වා තිබෙන වීථි ලාම්පු ටික නඩත්තු කිරීමට හැකියාවක් තිබෙනවා නම් අපි ඒවා නඩත්තු කරන්නට ඕනේ.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

පරිසර කමිටුවේ ගරු සභාපතිතුමාට මම ඉල්ලීමක් කරනවා, ස්නෝකල් එකක් නැති නිසා ගිය වර අපි අශෝක ශ්‍රී සරත් කුමාර මන්ත්‍රීතුමාගේ බූම් එකක් ගෙනත් පෙට්ටියක් සවි කරලා මහන්සියෙන් ලයිට් ටික

හැදුවා. විෂය නිළධාරීතුමියට කියලා බූම් එකක් හොයාගෙන නෙළුන්දෙණියේ සිට හැලගල ගල දක්වා වීථි ලාම්පු ටික අලුත්වැඩියා කිරීම් කරන්න. අද විදුලි පහන අපි ගෙනත් තිබෙනවා, ඒ නිසා මම රාජකරුණා මන්ත්‍රීතුමාට ඉල්ලීමක් කලා, කණ්ඩායම් සාකච්ඡාවේදී තීන්දු කලා කඩිනමින් වීථි ලාම්පු අලුත්වැඩියා කිරීම් කරන්න කියලා. ඊට සමගාමීව නෙළුන්දෙණියේ සිට හැලගල ගල දක්වා අපේ විදුලි පහන් අලුත්වැඩියා හෙටම පටන් ගන්න. යම් මුදලක් අවශ්‍ය වුනොත් ඒ බූම් එක සඳහා අපි ඒකට සභා අරමුදලින් දරන්න බැහැ. විපක්ෂ නායකතුමත් මමත් එකතු වෙලා යම් මුදලක් එකතු කරලා දෙන්න වුනොත් තෙල් ටික ලබා ගන්නට අපි දෙන්නා එකතු වෙලා නගරයේ ව්‍යාපාරිකයින්ට කතා කරලා අපි ඒක කරලා දෙන්නම්. අපේ ගාමිණී සහෝදරයා සම්බන්ධ කර ගෙන ඒ වැඩ ටික ආරම්භ කරන්නට කටයුතු කරන්න.

ඊළගට වැසිකිළිය තිබෙන ස්ථානයෙන් තමයි අතුරු මාර්ගය ගමන් කරන්නේ ඒ නිසා ඒක අදාල ආයතනය විසින් කඩා ඉවත් කරන්නේ. ඒ සඳහා අපට වන්දි මුදලක් ලැබුණා රුපියල් ලක්ෂ දහයක. ඒ මුදල යොදවලා තමයි අපි කසළ කළමණාකරණය සඳහා ඉඩමක් මිළදී ගත්තේ. ඒ මුදල අපට වන්දියක් ලෙස ලැබිලා තිබෙනවා. එය කඩනකම් අපි බලාගෙන ඉන්නේ. අපට වැසිකිළි හදන්න බැරි කමක් නෙවෙයි තිබෙන්නේ හදන වැසිකිළිය නඩත්තු කර ගන්න බැරි කමක් තිබෙන්නේ. මීරිගම හන්දියේ, දැදිගම, වාරියගොඩ, නෙළුන්දෙණිය වැසිකිළිය ටෙන්ඩර් දැම්මට ගන්නේ නැහැ. ඉතින් මොකක්ද කරන්නේ.අපි සතිපොළ භූමියේ කඩ කාමර ටික හැදුවා. කඩ කාමරය පිටිපස්සට ගිහිල්ලා බලන්නකෝ.වැසිකිළි පොච්චි තියලා නැහැ තාම. මේකේ ගිහිල්ලා ජරා කරලා. කොහොමද මේක කරන්නේ කියන්නකෝ. මමම මේක බලන්න යන්න ඕනේද. පෝච්චිය තියලා නැති වැසිකිළියක ජරා කරන මිනිස්සුත් එක්ක මොනවද කරන්න තියෙන්නේ. මොන දේශපාලනයක්ද මේ කරන්නේ කියන්නකෝ. මම හැමදාම උදේ පැයක් ඇවිදිනවානේ. මිනිස්සු මුළු වල ජරා කරනවා. ළමයි, ගුරුවරු පාසල් යන්නෙත් මේ පාරේ. අපි මේවා කොහාටද අරගෙන යන්නේ. හොඳ පහසුකම් තිබෙන වැසිකිළියක් හදලා තියෙනවා. මුදලත් අඩු කළානේ අපි. ඒකට යන්න බැරි නම් අපි මොකද දෙන දඬුවම කියන්නකෝ. ඇත්තටම එපා වෙනවා විෂය නිළධාරීන් ඉන්නවානේ. ඇත්තටම බොහොම කණගාටුයි.දේශපාලන අධිකාරියක් නැතුව පළාත් පාලන ආයතනයක් පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක බරපතල ප්‍රශ්නයක මම දැන් ඉන්නේ. ගිය සතියේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කැදෙව්වා ලංකාවේම සභාපතිවරු පනස් දෙනෙක්. සවස 1ට තිබුනා අගමැතිතුමත් එක්ක සාකච්ඡාවක්. එහිදී අපි කතා කරලා කිව්වේ පළාත් පාලන ආයතන වල බලය රදවා ගන්න ඕනේ නම්, ඒක්කෝ ඡන්දයකට යන්න ඕනේ. ඡන්දයකට යෑම පිළිබඳව මගේ කිසිම ප්‍රශ්නයක් නැහැ. පළාත් පාලන ආයතනයක දේශපාලන අධිකාරිය ක්‍රියාත්මක වෙන්න ඕනේ.මම දැඩිව ඒ මතයේ ඉන්නවා. ඒක කාට බලය ගියත් කමක් නැහැ. ප්‍රජාතන්ත්‍ර විරෝධී අයට බලය යන්නේ නැතිව, ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින දේශපාලන පක්ෂයකට මේකේ බලය යන්න ඕනේ. මහජන නියෝජිතයෝ පත් වෙන්න ඕනේ. මහජන නියෝජිතයෝ පත් නොවී 2016 හා 2017 මහජන නියෝජිතයෝ නොසිටි කාලයේ දඹුල්ල මහ නගර සභාවේ සභාපති ජාලිය ඕපාත සභාපතිතුමා කිව්වා, ඒ කාලයේ තමයි ඩෙංගු රතු කළාපයක් කරලා තිබුනේ. නමුත් නගරාධිපතිතුමා පත් වුනාට පස්සේ එක මරණයක් වත් වාර්තා වෙලා නැහැ ඩෙංගු වලින්. අපිත් රණ්ඩු වෙච් හරි පක්ෂ විපක්ෂ භේදයක් නැතුව ශ්‍රමදාන ටික ලැහැස්ති කරලා ශුද්ධ කරපු නිසා තමයි ඩෙංගු වලින් අපි බේරුනේ. දැන් දැන් ඉදිරිය පිළිබඳ පූර්වාදර්ශයක් පේනවා. තව වෙනකම් සී.සී.ටී.වී කැමරා පද්ධතිය හදලා නැහැ. මම සමහරුන්ගේ හැසිරීම් දිහා හොඳට බලාගෙන ඉන්නේ. මේ සභාව විසිරෙන්නේ නැහැ.මම දිගින් දිගටම රණ්ඩු කරන්නේ ඡන්දය තියන්න ඕනේ තැන.මහජන මතය උරගා බලන්න දෙන්න ඕනේ. ඒක විපක්ෂයට ඕනේ විදිහළු තියන්න ඕනේ නෙමෙයි මේක. ඒකත් කියන්න ඕනේනේ. විපක්ෂය කියන්නේ සජබේ වත් යූ.එන්.පි එකවත් නෙවෙයි. ජනතා විමුක්ති පෙරමුණ ගැන මම පැහැදිලිව කියන්නේ. ඒ අයට ඕනේ විදිහට ඡන්දය තියන්න බැහැ. මේවා දේශපාලන අතකොලු බවට පත් කරගෙන දැන් ඡන්දයක් තිබ්බොත් විකෘති දේශපාලන තත්වයක් බවට පත් කර ගෙන තමයි මේ රට හැදෙන්නේ. ඒක මහජන මතය නෙවෙයි. ඒ අයට ඕනේ මේ අර්බුද මැද අර්බුද වාසිය ගන්නට. මම කැමතියි මේ රට තවත් ස්ථාවර වෙලා ඡන්දයකට යනවට. ඒ වෙන මොකුත් නෙවෙයි මේකේ පැහැදිලිවම බිම තියන මතය නියෝජනය වෙන්නේ නැහැ. අද වෙනකොට පන්දම් පත්තු කරගෙන නගරයට ඇවිල්ලා. 100ක් වත් හිටියේ නැහැනේ මමත් දෙපාරක් ගියා . එදා හිටපු බල වේගය නැහැනේ. අඩුපාඩු ගැනත් කල්පනා කරමින් වැඩ කරන්න ඕනේ වෙලාවක්. අපි කණ්ඩායමක් ලෙස එකතු වෙන්න ඕනේ. මැතිවරණය තිබෙනවා නම් ඒ කාලයට අපි ප්‍රජාතන්ත්‍රවාදීව බල හුවමාරු කර ගන්න ඕනේ. පළාත් පාලන ආයතනයේ කටයුතු වලට මැදිහත් වෙලා බලන්න ඕනේ. දේශපාලන අධිකාරිය ලෙස අපි ඉන්නේ එක තැනක. අපි ඔක්කොම එකතු වෙන්න ඕනේ. පළාත් පාලන ආයතනයක බලය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට යන්න ඕනේ. අපි මේවා ආරක්ෂා කර ගන්න ඕනේ.රට විශේෂ තත්වයකට පත් වෙලා තිබෙන වෙලාවක්. මැතිවරණයක් නොතියා කොමසාරිස් පාලනයට යනවට මම 100%ම විරුද්ධයි.

ගෝෂාකාරී..................

**<u>ගරු මන්ත්‍රී එම්.බී. මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

එක්සත් ජාතික පක්ෂයේ ඉදලා අපි කාටවත් කිව්වේ නැහැ පක්ෂය අතහැරලා යන්න කියලා. පුරා අවුරුද්දක කාලයක් අපි ඔක්කොම නිහඬව හිටියා. අපි අඩුම තරමේ කණ්ඩායම් රැස්වීමක් වත් කලේ නැහැ. අපි කවුරුත් කැමති නැහැ සහෝදර මන්ත්‍රිවරු මෙතනින් ඉවත් වෙලා යනවට. අපි හැකිතාක් දුරක් මේ අය ආරක්ෂා කරගෙන ආවා. පසුගිය කාල සීමාව තුළ මැතිවරණයක් කියලා හිතා ගෙන නාම යෝජනා භාර දුන්නා, දිවුරුම් ප්‍රකාශයක් මත තව පක්ෂයකට භාර දුන්නා. අපි වෙන පක්ෂයකට ගිහිල්ලා තරග කරනවා වාගේ වැඩක් තමයි අද මේ ජයසිංහ මන්ත්‍රීතුමා කියන්නේ. ජයසිංහ මන්ත්‍රීතුමා කියනවා මේක අලි පොහොට්ටු එකතුවක් කියලා. එදා ඩලස් අලහප්පපෙරුම මහත්තයාට සජිත් ප්‍රේමදාස මහත්තයා ඇයි ඡන්දය දුන්නේ. අපට කියනවා අලි පොහොට්ටු ඉන්නවා කියලා. මතක තියා ගන්න එදා 71 කැරැල්ලක් ආවා වගේම එදා පාර්ලිමේන්තුවේ පඩිපෙළ ළඟට යනවා අරගල කාරයෝ, ප්‍රතිගාමී කාරයෝ යනවා, ජනාධිපති මන්දිරයට ගිහිල්ලා නාලා, කුස්සියට ගිහිල්ලා කාලා විනාශ කරලා එනවා. ඊළඟට රූපවාහිනියේ ප්‍රකාශනයක් කර ගන්න ඕනේ කියනවා. 71 කැරැල්ල වාගේ ප්‍රතිරූපයකට නැවත වරක් යන්නේ. මේ රටේ අහිංසක මිනිස්සු මැරුවා, ගෙවල් ගිණි තිබ්බා. දේශපාලනය කළ පලියට දේශපාලඥයාගේ ගෙවල් වලට ගිනි තියන්නවත්, දේශපාලඥයා මරන්නවත් නෙවෙයි තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය.ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ තමන් සියලු දෙනා ආරක්ෂා කරගෙන, රට ආරක්ෂා කරගෙන මේ ගමන යන්න තමයි ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ.පටන් ගත්තදා ඉදලා බලන්න එදා කර්මාන්ත ශාලා ගිනි තිබ්බා. රොටී අඹරලා ජීවත් වන රබර් කර්මාන්ත ශාලාව ගිණි තිබ්බා.සහතිකයක් ගන්න තිබෙන පොලිසි ටික ගිණි තිබ්බා. පොලිසියට ගැහුවා. සාජන්ලා තුන් දෙනෙක් මැරුවා.බස් ටික ගිණි තිබ්බා, ට්‍රාන්ස්පෝමර් ටික ගිණි තිබ්බා. දුගී දුප්පත් ජනතාව පදිංචිය සනාථ කරන හැඳුනුම්පත ගත්තා. අහිංසක මිනිස්සුන්ගේ බෙලි කැපුවා බෝක්කු උඩ තියලා. අරගලයක් ඇති කලා. නැවත වරක් අරගලයකට යන මොහොතෙදි තමයි ලොකු කුණාටුවකට අහු වෙනවා තව දවස් 04ක් තිබ්බා නම්. සභාපතිතුමා කිව්වා වාගේ වෙන ආණ්ඩු ක්‍රමවේදයකට යන්න ලැහැස්ති වුනේ. දවස් හතරකින් මේ රට භාර ගන්න කියලා කිව්වා . එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නෙවෙයි ජාතික ලැයිස්තුවෙන් යන්නේ. ගිහිල්ලා එදා පාලකයෙක් ලෙස මේක පාලනය කරන්න හොද සුදුස්සෙක් හිටියේ නැහැ. ජනතා විමුක්ති පෙරමුනේ තුන් දෙනෙක් හිටියා අපි පාලනය කරනවා කියලා ගන්න තිබුනා. සමගි බල වේගයේ හිටියා 47ක්. අපි මේක භාර ගන්නවා කියලා, කියලා තිබුණත් කවුරුත් මේක බාර ගත්තේ නැහැ. ඔක්කොම අත ඇරිලා ගියා අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, කාලයක් හිටපු අගමැතිවරයෙක් හැටියට 133කගේ අගමැති වරයා වෙනවා,133කගේ ජනාධිපතිවරයා වෙලා මේ බලය අතට ගන්නවා.ඉන් පසු අපි අරගලය නිමා කරලා මේක යථා තත්වයට පත් කලා. එදා පත් කලේ නැතිනම්, මතක තියා ගන්න ඉතිහාසයේ පෙට්‍රල් පෝළීමක් තිබුණා මිනිස්සු ගහ මරා ගත්තා.දොස්තරලට ගැහුවා. ආරක්ෂක නිළධාරීන්ට ගැහුවා. සාමාන්‍ය පුද්ගලයාට හැහුවා. පෙට්‍රල් ටික ගන්න ගිහිල්ලා ගුටිකාලා මරා ගත්තු මිනිස්සු ඉන්නවා. කඩා කප්පල් වූ පවුල් ගණනාවක් තිබෙනවා.ඒ වගේ අවස්ථා තිබුනා.ගෑස් ටික තිබුනේ නැහැ.කොළඹ හතේ ඉන්න මිනිස්සුන්ට හා නාගරික ප්‍රදේශ වල ඉන්න අයට ගෑස් ටික තිබුනේ නැහැ. ඒ ගෑස් නැති අවස්ථාවේදී හර්ස් ටික අරගෙන යන්න පෙට්‍රල් ටික තිබුනේ නැහැ. ආදාහනාගාර වල ගෑස් තිබුණේ නැහැ.පරණ ක්‍රමයට සෑයවල් හදලා පරණ ක්‍රමයට ගියා. ඒ ක්‍රමවේදය යථා කාලයේදී ගෑස්ටික දීලා පෙට්‍රල් ටික දීලා මේ ආර්ථිකය ගොඩ නගා ගෙන ඉන්නවා. මේකට අලි පොහොට්ටු කියලා කියන්න එපා. ජනාධිපතිලා පත් කළේ එක්සත් ජාතික පක්ෂයෙන් නෙවෙයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රිවරු අතරින් නිර්පාක්ෂික ජනාධිපතිවරයෙක් පත් කරනවා. කතාවට ගන්නවා මේක අලි පොහොට්ටු කියලා. ගමට ගිහිල්ලා කියනවා අලි පොහොට්ටු මේ තියෙන්නේ කියලා. ඉදිරි අනාගතයේදී ඡන්දයක් එහෙම බලාපොරොත්තු වෙන්න එපා. ජනතා විමුක්ති පෙරමුණ ගෙයක් ගෙයක් ගානේ ගියා. අන්තිම මොහොතේ මිනිහෙක් මැරුණට පස්සේ කියන්නේ මේ මිනියට ගරු කරන්න කියලා කියනවා. මේ රට හදනවා කියලා උඩ ගෙඩි දීලා කියනවා.මේ සන්නද්ද කල්ලියේ ඉදිරියේ ඉන්න ඕනේ නායකයා එදා දොරක් කඩා ගෙන ගිහිල්ලා හැංගුණා. මේ නායකයෝ පස්සේ ගිහිල්ලා අතරමං වෙන්න එපා. ඒ නිසා තමයි අපේ මුණසිංහ සහෝදරයා අපේ ප්‍රාදේශීය සභාවේ නායකයා ගොඩ දා ගන්න එතුමා එදා නිහඬ වෙලා හිටියා. අපි අගය කරනවා. අපි ගැමි කමට ජීවත් වෙන කට්ටිය. අපට ප්‍රාදේශීය සභාවක් ලෙස ප්‍රතිපත්ති තිබෙනවා සහෝදර මන්ත්‍රිවරු ලෙස. මෙතන ආණ්ඩු පක්ෂය කියලා නැහැ. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් නැහැ. සමගි පෙරමුණ පක්ෂයක් නැහැ. මේ සියලු දෙනාටම ඡන්ද අයිතිය දීලා තිබෙන්නේ ඒ ප්‍රදේශයේ ජනතාව. ජනතාව ඡන්දය දීලා තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම් වසම 78යි, ගම 225යි, ජනතාවට සේවය කරන්න තමයි අපි පත් වෙලා

තිබෙන්නේ. අපට විපක්ෂය කියලා කකුලෙන් අදින්න තිබුනා. අපි ඇද්දේ නැහැ. අපේ පරමාර්ථය කුමක්ද ජනතාවට සේවය කිරීමේ පරමාර්ථය නිසා තමයි අපට ඇවිදින මංතීරුව, හෙළ බොජුන්හල හදන්න පුළුවන් කම ලැබුනේ. වරිපනම් පරිගනක ගත කරලා අපි වරිපනම් යථා තත්වයට පත් කර ගත්තා. මගේ වර්පනම් අංකය පවා මාරු කලා හපු ආරච්චි මහත්තයා. 1951 එක්දහස් නවසිය හැට ගණන් වල17600 නඩු අංකය උසාවියට අරගෙන යනවා.ප්‍රාදේශීය සභාවේ රොබට් මහත්තයාලා අරගෙන යනවා. අදත් බලනකොට පොත ටිපෙට්ස් කරලා තිබෙනවා අංක 140ය. ඒ වාගේ යුගයක් නැති කරා ගරු සභාපතිතුමා මම එතුමාට ස්තූතිවන්ත වෙනවා. වරිපනම් පරිගණක ගත කරලා ලේඛන ගත කරලා ක්ෂණිකව කට්ටියට උපකාර කිරීම පිළිබඳව.කඩා වැටුන පරිපාලනය යථා තත්වයට පත් කර ගන්න සියලු දෙනාම ඇප කැප වෙලා අවුරුදු 4ක් අපි කැප කලා. මටත් හිතෙනවා යම් කිසි අවස්ථාවක කොමසාරිස් පාළනයට ගියොත් මේක අඩපණ වෙනවා. මේවා ක්‍රියාත්මක කරන්නට බැරි වෙනවා. ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයෙක් ඉදලා මන්ත්‍රිවරු ඉදලා මේ වැසිකිළි අපවිත්‍ර කරනවා නම්, බල ප්‍රදේශයේ යම් යම් දේ කරනවා නම් කොමසාරිස් පාලනයට ගිය විට කුමක් වේවිද. ෂරිප් මන්ත්‍රීතුමයි සභාපතිතුමයි අයියයි මල්ලි වගේ කියනවා සමහරු.නමුත් මතක තියා ගන්න අපි පොදු දේ හොද දේ හොද පැත්තෙන් දැකලා පොදු දේ පොදු විදිහට කරනවා මිසක් අපි කවදාවත් කකුලෙන් ඇද්දේ නැහැ.අපි කවුරුත් මෙතන වාද විවාද වෙන්න එපා.මම අද වුනත් කණගාටු වෙනවා මගේ ඉන්න මන්ත්‍රී කණ්ඩායම එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරලා ජාතික ලැයිස්තුවෙන් පත් කරපු මන්ත්‍රිවරු අපිත් එක්ක එකට ඉන්න ඕනේ කියන මතය තමයි තිබුනේ. නමුත් අපි විපක්ෂයක් ලෙස කරු අයියා මට කියනවා කණ්ඩායම් රැස්වීම් කැදවන්න කියලා. අපි කැදෙව්වේ නැහැ. කාලයක් දුන්නා. අපේ මන්ත්‍රීවරු අපිත් එක්ක ඉන්න ඕනේ කියන එක. අද අපි ආරක්ෂා කලා. අපි කිව්වේ නැහැ යන්න කියලා.මම ප්‍රාර්ථනා කරනවා ඊළඟ මැතිවරණයේදී සමඟියෙන් හරි ඇවිල්ලා මේ සභාවේ සමගියෙන් වැඩ කරන්න ඔබ තමුන්නාන්සේලාට ශක්තිය ධෛර්ය ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. අපේ කුහක දේශපාලනය නැහැ. අද මේ කතා කරන අපිට දේශපාලනයේ ඉන්නත් පුළුවන් නැති වෙන්නත් පුළුවන්. අපට සහෝදරත්වය තිබෙනවා. හිටපු විජේතුංග සභාපතිතුමා මන්ත්‍රිවරයෙක් කියන මතය උඩ යම් කිසි කරදරයක් වුනොත් පක්ෂ පාට වලින් තොරව මේ අය ඉදිරිපත් වෙලා තිබෙනවා. අසනීප තත්වයක් වුනා නම්, ලෙඩ රෝග ඇති වුනා නම් මගේ මන්ත්‍රීවරයා කියන මතය මෙතුමා ළග තිබුනා. මොකක් හරි වුනා නම් මගේ මන්ත්‍රීවරයා ආරක්ෂා කරන්න ඕනේ කියන මතය තිබුනා. අපි ගමට යන විට ගහට ගහක් මොරටුවේදී හම්බ වෙනවා වගේ අපි හමුවෙලා සුහදව වැඩකටයුතු කරන්න ඕනේ. මම කණගාටු වෙනවා මේ වාගේ පටු දේශපාලනයෙන් කටයුතු කරන එකයි, පටු දේශපාලනය ක්‍රියාත්මක කරන එකයි අද ඉදලා අත ඇරලා සහෝදරයෝ වගේ එකා වාගේ යන්න පුළුවන්. මගේ තාත්තගේ නම කිව්වට කමක් නැහැ මේ ලංකාවේ සැම දෙනාම දන්නවා.

ගෝෂාකාරී.................................................

මම යතාර්ථයට මේ කිව්වේ. ලබන සැසි වාරයෙත් ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරු බවට පත් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා.ස්තූතියි.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

දේශපාලනයේ සදාකාලික මිතුරොත් නැහැ. හතුරොත් නැහැ කියලා කිවේ ලලිත් ඇතුලත් මුදලි ඇමතිතුමා. එක්සත් ජාතික පක්ෂයත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණත් යම් එකගතාවයක දේශපාලන කාරණා යනවා. සජිත් ප්‍රේමදාස මහත්තයත්, අපේ ඩලස් අලහප්පපෙරුම ඇමතිතුමන්ලා, වාසුදේව නානායක්කාර ඇමතිතුමන්ලා, උදයගම්මන්පිල ඇමතිතුමන්ලා යන අයත් යම් එකගතාවයක දේශපාලනය යනවා.පක්ෂ ප්‍රතිපත්ති තියාගෙන යම් පොදු අරමුණකට ඒ අය එකතු වෙනවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. පක්ෂය විපක්ෂය කියලා මම සළකන්නේ නැතුව ඔබේ පෞද්ගලික ප්‍රශ්නයකදී පවා මම පෙනී හිටියා. නායකයා වුනාම මම ඒක කරන්න ඕනේ. මම සභාපති වුණාම මම මගේ මන්ත්‍රීවරුන්ට ඒක කරන්න ඕනේ.පනතේ කොහෙවත් නැ විපක්ෂයක් කියලා දෙයක්. පනතේ තිබෙන්නේ සභාපති උප සභාපති හා සභිකයෝ කියලා. සියලු දෙනාම මමත් එක්ක එකට යන අය. ඔබගේ ආරක්ෂාව ඔබගේ මන්ත්‍රීධූරයේ වරප්‍රසාද ඔබගේ මන්ත්‍රීධූරයේ ගෞරවය මම රකින්නේ නැතිනම් එතනින් එහාට කවුරු රකින්නද.

ගෝෂාකාරී................................

මම කොහොම හරි මේ කොට්ඨාසය දිනවනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 03 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 04**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභාවට නව ආදායම් උත්පාදන මාර්ගයක් මෙන්ම මහජන උපයෝගීතා සේවාවක් වන ඇවිදින මංතීරුව සහ ළමා උද්‍යානයට අලුතින් ජල සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා අදාළ මූලික වියදම් සහා අරමුදලෙන් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 04 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 05**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය වෙත එකතු වෙන ප්ලාස්ටික් බෝතල් දැනට එන්. වේදනායගම් මහතා හට කිලෝවක් රු. 35.00ක මුදලකට අලෙවි කරන අතර, රත්නපුර සිලෝන් එමරල් වේ (පුද්) සමාගම විසින් ඊට වඩා වැඩි මිලකට එනම්, ප්ලාස්ටික් බෝතල් කිලෝ 1ක් රු.50.00කට හා බේල් කරන ලද ප්ලාස්ටික් බෝතල් කිලෝ 1ක් රු. 70.00ක මිලකට ලබා ගැනීමට එකඟ වී ඇත. මෙම ආයතනයට ප්ලාස්ටික් බෝතල් අලෙවි කිරීමෙන් ප්‍රාදේශීය සභාවට වඩා වැඩි ආදායමක් ලබා ගත හැකි වන අතර ටෙන්ඩර් කැඳවීම සිදු කරන තෙක් එකතු වන ප්ලාස්ටික් බෝතල් රත්නපුර සිලෝන් එමරල් වේ (පුද්) සමාගමට අලෙවි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

මම හම්බ වෙන්න පුද්ගලයෙක් ආවා. ඒ ආව විට මම ඇහුවා ඔයාල බෝතල් කීයටද ගන්නේ කියලා. රුපියල් 70.00ට ගන්නවා කියලා කිව්වා. දැනට අපි දෙන්නේ රුපියල් 35.00ට. මම ලේකම්තුමියට කිව්වා ටෙන්ඩර් කරන තෙක් දැනට අර පුද්ගලයාට රුපියල් 70.00ට දෙන්න කියලා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 05 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 06**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

මෙම සභාවට අදාල වරිපනම් බදු දේපළ තක්සේරුවක් අවසන් වරට සිදු කර ඇත්තේ 2007 වර්ෂයේදීය. ඒ අනුව වරිපනම් දේපළ නැවත තක්සේරුව 2022 සැප්තැම්බර් මස සිට ආරම්භ කිරීමට යෙදුණු අතර ඒ සඳහා තක්සේරු නිළධාරීන් සඳහා සහායකයන් ලෙස ස්ථිර කම්කරු මහතුන්ට අමතරව බහු කාර්යය සංවර්ධන සේවා පදනමින් සිටින සේවක මහතුන්ද යොදා ගෙන ඇත. එබැවින් එම බහුකාර්ය සංවර්ධන සහායක සේවකයන් සඳහාද තක්සේරු කටයුතු සඳහා සහභාගී වන දින ගණන් වලට අදාලව සංයුක්ත දිමනාව 2022

සැප්තැම්බර් මස සිට එම තක්සේරු කටයුතු අවසන් වන තුරු ගෙවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

2007 තමයි අපි දේපළ තක්සේරුවක් කරලා තිබුණේ. ඒ නිසා විශාල ආදායමක් අපට අහිමි වෙලා ගියා. මේ සඳහා සිටින සේවක සංඛ්‍යාව අපට ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අපි බහුකාර්ය සහයකයින් යෙදෙව්වා. ඒ වාගේම මාර්ග සිතියම් කිරීමටත් බහුකාර්ය සේවකයින්ගේ සේවය අපි ලබා දීලා තිබෙනවා. ඒ අය සඳහා සංයුක්ත දීමනාව සහා අරමුදලින් ගෙවීමට මම යෝජනා කර සිටිනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 06 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 07</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

වරකාපොල නගරයේ ගොඩනැගිලි අනුමත කිරීමේදී වාහන නැවතීමේ පහසුකම් සඳහා ප්‍රමාණවත් ඉඩම් නොමැතිවීම විශාල ගැටළුවක්ව පවතී.

නාගරික සංවර්ධන අධිකාර පනත අනුව නගරයේ රථගාලක් ඉදිකිරීම සඳහා මුදල් ගෙවා එම පහසුකම් ලබාගෙන ගොඩනැගිලි අනුමත කිරීමේ හැකියාව පවතී.

ඒ සඳහා නගර මධ්‍යයේ පවතින ළමා උද්‍යානයට යාබද ඉඩම පරිත්‍යාගශීලීන් හා ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පස් ප්‍රාදේශීය සභාව සතු වාහන හා සේවකයින් යොදවා එම ස්ථානය වෙත රැගෙනවිත් එම ස්ථානය සකස් කර රථගාලක් ඉදි කිරීමට සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එච්.සේනක ප්‍රියන්ත කුමාර මැතිතුමා.</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

මේ කියන්නේ අපේ ඇවිදින මංතීරුවට හා යූ.ඩී එකටයි මැද තිබෙන කොටස අපේ. මම අදහස් කරගෙන ඉන්නේ කවුරු හරි අපට පස් ලබා දෙනවා නම්, පස් වලට මුදල් දෙන්නේ නැතිව මේ ටික පුරවා ගෙන, වරකාපොල නගරය නවීකරණය කිරීමේදී පැරණි වෙළඳසැල් කඩලා අලුතෙන් හදන්න නම් පර්චස් 06ක භූමි කොටසක් තිබෙන්නට ඕනේ. ඊට අමතරව මේ ඉඩම අනුමත කරන විට යූ.ඩී එකේ නීතියට අනුව රථගාලක් දෙන්නම ඕනේ. රථගාලක් දෙන්න විදිහක් නැහැ ආර්.ඩී එකෙන් බට වැට කපන්නේ නැහැ.මම මේ එක දිගට ආව කතන්දර ගොඩක් ඔබට කියන්නේ. ආර්.ඩී එකෙන් ආරක්ෂිත බට වැට කපා ගන්න විදිහක් නැහැ. ඇතුල් වීමක් නැහැ. කවුරු හරි බට වැට කපපු විට එතනින් ඇතුල් වීම හම්බ වෙනවා. මේ කරන නීති විරෝධී වැඩ. ඒ අයට කඩේ හදා ගන්නත් ඕනේ.පර්චස් දෙකයි තිබෙන්නේ. ඒ අයට මම කිව්වා ඔයාලට පර්චස් 06ක් ඕනේ නිසා අල්ලපු කඩේ අයත් එක්ක එකතු වෙලා එක ප්ලෑන් එකක් හදා ගන්න කියලා. සභාව අනුමත කරලා දෙන්නම් තමන්ගේ එක බිත්තියකින් වෙන් කර ගන්න පුළුවන් අපට පර්චස් 06ම ගොඩනැගිල්ල අනුමත කරනවා. කොච්චර දැගලුවත් වැඩක් නැහැ නගරය නවීකරණය කරන්න බැහැ නීතිමය ප්‍රශ්න නිසා. අපට රථගාලක් දෙන්නේ නැති නම්, පනතේම තිබෙනවා පළාත් පාලන ආයතනය විසින් සකස් කරන ලද පොදු රථගාලක් තිබෙනවා නම්, ඒ රථ ගාල පාවිච්චි කරන්න දෙනවා කියලා, සභාවට යම් මුදලක් අය කරලා දෙන්න පුළුවන් අර ගොඩනැගිලි සැළසුම අනුමත කරන්නට. අපි හිටියා නැතා මේ මිනිස්සුන්ට මේ කඩ ටික හදා ගන්න යම් නීත්‍යානුකූල තත්වයක් හරි ගස්සන්න ඕනේ. ඒ නිසා ඇවිදින මංතීරුවට එහා පැත්තේ තිබෙන භූමියට කාගෙන් හරි දෙන පස් ටිකක් ඇවිදින මංතීරුවට හා ළමා උද්‍යානයට පිරෙව්වා වගේ ඉවත් කරන පස් ඉවත් කරන ගොඩනැගිලි ද්‍රව්‍ය ටික අරගෙන මෙක පුරවලා ඉතාමත්ම කඩිනමින් මේකේ

රථගාලක් හදලා අවසන් කරන්න තීන්දු කළා. කාරණා කිහිපයක් නිසා. පොදුවේ ගත්තොත් වරකාපොල නගරයට රථගාලක් නැහැ. පිට ප්‍රදේශවලට රැකියා වලට යන අයට වාහන දාන්න තැනක් නැහැ. හොරුන් විසින් වාහන කිහිපයක්ම හොරකම් කලා. මගේ රියදුරු මහත්තයා අමිලගේ වාහනය හොරුන් විසින් ඉස්සුවා. කිසිම තොරතුරක් නැහැ. අපට සභාවට අරමුදලකුත් ලැබෙනවා. ඒ අනුව තමයි ඒක හදන්නේ. යූ.ඩී.ඒක මඟින් ගොඩනැගිලි සැළසුම අනුමත කිරීමේදී ඒ නීතිමය ආවරණය දෙන්න තමයි තීන්දු කලේ. අපි අතුරු ව්‍යවස්ථා හදලා අපි ගොඩක් දේවල් කලා. විපක්ෂ නායකතුමා කිව්වා වගේ වරිපනම් අංශයේ මහා විකාර නටපු පොත් තිබුණේ. අපි ඒ දේවල් ගොඩක් වෙනස් කළා. සභාව දීර්ඝ කලා හෝ නැතා හෝ අපි අවසාන තත්පරය දක්වාම අපේ සේවාවන් ටික කරන්න ඕනේ.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 07 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 08**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් කැබලිකර විකිනීමේදී ප්‍රාදේශීය සභාව වෙත පොදු කටයුතු සඳහා වෙන් කරනු ලබන ඉඩම්වල ආරක්ෂාව සඳහා ස්ථිර මායිම් කණු යොදා මායිම් ස්ථාපිත කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

දැනට ඉතාමත් වේගයෙන් අපේ බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර විකුණමින් යනවා. මේ කට්ටි කිරීමේදී පළාත් පාලන ආයතනය වෙනුවෙන් වෙන් වන පොදු ඉඩම් ටික කෝටු ටිකක් ගහලා වෙන් කරලා දෙනවා. මම කිව්වේ හතර මුල්ලට හරි ස්ථිරම කොන්ක්‍රීට් කණු කාර්මික නිළධාරී උපදෙස් මත අඩි දෙකක් තුනක් යටට හාරලා අපට දෙන මොහොතේ ඒ මායිම් ටික සළකුනු කරලා ගන්න ක්‍රමයක් සකස් කර ගන්න කියලා. කාර්මික නිළධාරී උපදෙස් මත අඩියේ, අඩියේ කණුවක් හරි දමන්න පුළුවන්නේ. ඉස්සරහට එන ටික හරි රැක ගන්න ඕනේනේ. ඒ කාරණාව මත තමයි මේ යෝජනාව දැම්මේ. සභාවට පොදු ලකුණක් හරි යොදවලා මායිම් ගල් ටික දමන්න ඕනේ.

**ගරු මන්ත්‍රී එස්.ආර්.කේ.ලොකුගලප්පත්ති මැතිතුමා.**

වෙන්දේසිකරුට කීවා නම් හරි අපේ ටික මායිම් කරලා දෙන්න කියලා.සභාපතිතුමා මේක කරලා දෙන්න කියලා කියන්න.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

කණු ටික දාලා දෙනවා. ඒ අය ලී කණු තමයි දමන්නේ. මම කතා කරලා බලන්නම්. සභාවේ මුදල් යොදවන්නේ නැතුව කරන්න තමයි බලන්නේ.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 08 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 09**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**
**2023.02.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ පහත සඳහන් නිර්දේශයන් අනුමත කිරීමට මහ සභාවට යෝජනා කරමි.**

01. කොළඹ පාර නෙළුන්දෙණිය වරිපනම් අංක 105/9 හා 105/9 ඒ තහඩු සෙවිලි වැඩපල හා උළු සෙවිලි කුඩා නිවස යන වරිපනම් දේපල එස්.එච් ධර්මරත්න යන නමින් ලේඛණ ගතව ඇත. එම අය අංශභාග රෝගයෙන් පීඩා විඳින බවත් රැකියාවක් කර ගැනීමට නොහැකිව දරිද්‍රතාවයෙන් පෙලෙන බවත් එමනිසා වරිපනම් ගෙවීමට නොහැකි බවත් දන්වා ඔහුගේ බිරිද වන එච්.ඇග්නස් ශ්‍රී චන්ද්‍රකාන්ති මිය විසින් ලිඛිතව කල ඉල්ලීම ආදායම් පරීක්ෂක මහතා විසින් පරීක්ෂා කර වාර්තාකර ඇති අතර අදාල වසම භාර ග්‍රාම නිලධාරී විසින් ද අඩු ආදායම්ලාභී පවුලක් ලෙස සහතික කර ඇත.

ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 135(ඉ) වගන්තිය යටතේ ප්‍රවර්ථන වර්ෂයේ වරිපනම් බදු වන රුපියල් 1233.17 ක මුදල හා 182 වගන්තිය යටතේ හිඟ වරිපනම් බදු මුදල වන 2529.52 ක මුදල කපා හැරීම සුදුසු බවට මහසභා සම්මතයක් ලබාගෙන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යැවීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

| අනු අංකය | වරිපනම් ප්‍රදේශය | වරිපනම් අංකය | නම | දේපල විස්තරය | 182 වගන්තිය යටතේ 2021.12.31 දක්වා කපාහැරිය යුතු හිඟ | 135(ඉ)වගන්තිය යටතේ 2022 වර්ෂයේ 12-31 දින දක්වා කපා හැරිය යුතු ප්‍රවර්තන වටිනාකම |
|---|---|---|---|---|---|---|
| 01 | කොළඹ පාර නෙළුන්දෙණිය | 105/9 | එච්.එස් ධර්මරත්න | තහඩු සෙවිලි වැඩපල | 2341.96 | 1138.30 |
| 02 | කොළඹ පාර නෙළුන්දෙණිය | 105/9 ඒ | එච්.එස් ධර්මරත්න | උළු සෙවිලි කුඩා නිවස | 187.56 | 94.87 |
| එකතුව | | | | | 2529.52 | 1233.17 |

02) ගලපිටමඩ පාර තුන්තොට වරිපනම් අංක 64/3 උළු සෙවිලි නිවස යන වරිපනම් දේපල ඒ.කේ ජයසේන යන නමින් ලේඛණගතව පවතියි. එම අය නිසි රැකියාවක් කරගැනීමට නොහැකිව දරිද්‍රතාවයෙන් පෙලෙන බවත් එමනිසා වරිපනම් ගෙවීමට නොහැකි බව දන්වා ඔහුගේ මව වන එච්.පී පොඩිමැණිකේ මිය විසින් ලිඛිතව කල ඉල්ලීම ආදායම් පරීක්ෂක මහතා විසින් පරීක්ෂා කර වාර්ථා කර ඇති අතර අදාල වසම භාර ග්‍රාම නිලධාරී විසින්ද අඩු ආදායම්ලාභී පවුලක් ලෙස සහතික කර ඇත.

ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 135(ඉ) වගන්තිය යටතේ ප්‍රවර්ථන වර්ෂයේ වරිපනම් බදු වන රුපියල් 173.97 ක මුදල හා 182 වගන්තිය යටතේ හිඟ වරිපනම් බදු මුදල වන 884.89 ක මුදල කපා හැරීම සුදුසු බවට මහසභා සම්මතයක් ලබාගෙන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යැවීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

| අනු අංකය | වරිපනම් ප්‍රදේශය | වරිපනම් අංකය | නම | දේපල විස්තරය | 182 වගන්තිය යටතේ 2021.12.31 දක්වා කපාහැරිය යුතු හිඟ | 135(ඉ)වගන්තිය යටතේ 2022 වර්ෂයේ 12-31 දින දක්වා කපා හැරිය යුතු ප්‍රවර්තන වටිනාකම |
|---|---|---|---|---|---|---|
| 01 | ගලපිටමඩ පාර තුංතොට | 64/3 | ඒ.කේ ජයසේන | උළු සෙවිලි නිවස | 884.89 | 173.97 |

03) කොට්ඨාශ අංක 02 කොළඹ පාර - දකුණ වරිපනම් ප්‍රදේශයේ වරිපනම් අංක 144/1 අංක යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හි.කි.එස්. ඒ. ගුණවර්ධන නමින් , තහඩු සෙවිලි රෝහල් ආපන ශාලාව යන දේපල සඳහා මෙතෙක් වරිපනම් බදු ගෙවාගෙන පැමිණ ඇති අතර ඒ දේපල සඳහා නව අංකයක් ලබා ගැනිමට ලදුපත් අංක 018993 යටතේ රුපියල් 1500.00 ක් ගෙවා දේපල අයදුම්පත්‍රයක් ලබා ගෙන ඇත.

එම දේපල සඳහා නව අංකයක් අවශ්‍ය නොවන බැවින් දැනට 144/1 ලෙස අංකයක් පවතින නිසා අයදුම්පත්‍රය සඳහා ගෙවන ලද මුදල ආපසු ඉල්ලා සිටි.

එම මුදල දැනට ආදායමට ගෙන ඇති බැවින් ආදායමින් නිදහස් කර ලබා දිම සඳහා මුදල් කමිටු නිර්දේශයක් මගින් මහා සභා අනුමැතියක් ලබා ගෙන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියෙන් පසු නිදහස් කිරිමට හැකියාව ඇති බැවින් මෙම මුදල විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියෙන් පසු නිදහස් කිරිම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04) 2023 වර්ෂය සඳහා කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා දිනමිණ පුවත්පත් දැන්වීමක් පල කිරිම වෙනුවෙන් රු.7038.00 ක මුදල ''ද ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ්'' වෙතට මුදල් ගෙවීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 09 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 10</u>**

<u>කර්මාන්ත කමිටුවේ ගරු සභාපති එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව .</u>

<u>2023.02.21 වන දින පැවති කර්මාන්ත කමිටුවේ කල් දී ඇති යෝජනාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.</u>

<u>01.ඇස්තමේන්තු</u>

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු මුදල |
|---|---|---|
| 01 | වරකාපොල ළමා උද්‍යානයේ ප්‍රධාන ගේට්ටුව සපයා සවි කිරීම | 650000.00 |
| 02 | තඹදිය පෙර පාසල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 600000.00 |

| | | |
|---|---|---|
| 03 | තල්ලියද්ද හිංගාහෙට්ටිය පාලම අසල ආපදාවට ලක්වී ඇති පැති බැම්ම සෑදීම | 2000000.00 |
| 04 | මායින්නොළුව පැළවත්ත මාර්ගයේ වර්ෂාපතනය නිසා බාදනයට ලක්වී ඇති ස්ථානයේ ආරක්ෂිත බැම්මක් ඉදි කිරීම | 1000000.00 |

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 10 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 11</u>**

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>
2023 වර්ෂය සඳහා උත්සව අත්තිකාරම් ගෙවීම මෙම වර්ෂයේ අප්‍රේල් මස වන විට සිදුකල යුතු වුවත් සේවක ණය ගිණුමේ ඒ සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් පොදු ගිණුමෙන් රුපියල් ලක්ෂ 10ක මුදලක් සේවක ණය ගිණුමට මාරු කර උත්සව අත්තිකාරම් ලබා දීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 11 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 12</u>**

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>

2023.01.24 සිට 2023.02.23 දක්වා වූ ආවරණ අනුමැතියට යටත්ව කරන ලද රු. 3,832,382.95 ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 12 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 13</u>**

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>
ගණිතපුර හංදිය මාළු ලැල්ල ස්ථානයක් සපයා ගත යුතුය යන පදනමේ සිට පළමු වර, දෙවන වර, තෙවන වර හා සිව්වන වර ටෙන්ඩර් කලද කිසිවෙකුත් ටෙන්ඩර් ලබා ගැනීමට ඉදිරිපත් නොවිය.

| සභා දේපල | පළමු වර ටෙන්ඩර් කල අවම ලංසු මුදල (2023.01.01 -2023.12.31) | දෙවන වර ටෙන්ඩර් කල අවම ලංසු මුදල (2023.01.01-2023.12.31 | තෙවන වර ටෙන්ඩර් කල අවම ලංසු මුදල (2023.01.01-2023 .12.31) | සිව්වනවර ටෙන්ඩර් කල අවම ලංසු මුදල (2023.02.15-2023 12.31) |
|---|---|---|---|---|
| ගණිතපුර හංදිය මාළු ලැල්ල | **54060.60** | **54060.60** | **48654.54** | **42572.72** |

පසුව ඒ,145,හදුන්ගොඩ, දොරවක පදිංචි එම්.ආර්. රනිල් චාමර අමරතුංග මහතා විසින් 2023 වර්ෂයේ මාර්තු මස 15 සිට 2023.12.31 දක්වා ඉදිරි මාස නවය හමාරක කාලය සඳහා මෙම මාළු ලැල්ල රුපියල් 43000.00 ක මුදලකට කර ගෙන යාමට කැමති බව දන්වා ලිපියක් ලබා දී ඇත. ඒ අනුව මෙම මාළු ලැල්ල සිව්වන වර ටෙන්ඩර් කල අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ඉල්ලුම් කර ඇති බැවින් ද ටෙන්ඩර් ලබා නොගෙන මේ ආකාරයට කාලයක් පැවතීම නිසා සභාවට ලැබෙන ආදායමක් අහිමිවීමක් වන බැවින්ද එම්.ආර්. රනිල් චාමර අමරතුංග මහතාට 2023 වර්ෂයේ ඉදිරි මාස කිහිපය සඳහා මෙම මාළු ලැල්ල රුපියල් 43000.00 ක මුදලකට බදු ලබා දීම පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බව මම මේ ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>
අපේ මාළු ලැලි ටෙන්ඩර් කිරීමේදී ගණිතපුර මාළු ලැල්ල ගත්තේ නැහැ. පළමුවර කළා , දෙවන වර කළා, තෙවන වර කළා කවුරුත් ගත්තේ නැහැ. හතර වන වරත් කලා එත් කවුරුත් ගත්තේ නැහැ.එක්කෙනෙක් ඇවිත් ඉල්ලුවා මේ මාළු ලැල්ල.හතර වන වර ටෙන්ඩර් කළේ අර මුදලට වඩා වැඩි මුදලකට. ඒ පුද්ගලයාට ලබා දෙන්න තීන්දු කලා ඉතිරි මාස ගණන.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 13 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

<u>**ඉ - 14**</u>
<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>
වරකාපොල සතිපොල භූමියේ ඉදිකරන ලද නව කඩ කාමර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ අංක 09 දරණ කඩ කාමරය දීර්ඝ කාලීන බදු පදනම යටතේ 2023 වර්ෂයේ සිට වසර 30 කාලසීමාවක් සඳහා බදු ලබා දීම සඳහා වූ 2023.02.10 වන දින දිනමිණ පුවත්පතේ පලකල ප්‍රසම්පාදන දැන්වීම අනුව ටෙන්ඩර් විවෘත කිරීම 2023.03.03 වන දින පෙ.ව 10.15 ට වරකාපොල ප්‍රාදේශීය සභාවේදී සිදු කරන ලදී. ඒ සඳහා වූ පහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ පිළිගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**01.** වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 09 කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර 01 ක් ලැබී තිබුණි.මෙහි අවම ලංසු මුදල රු. 840000.00 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| සෙල්වරාජා සෙල්ව කුමාර් | ඊ 66,තැඹිලිගහමඩ පාර, දුම්මලදෙණිය, වරකාපොල | 845000.00 |

වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 09 දරණ කඩ කාමරය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම්පතක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා සෙල්වරාජා සෙල්ව කුමාර් මහතාගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී.

ඒ අනුව ඉහත ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ පිළිගැනීම සුදුසු බවටත් ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් මම මේ ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>

අපේ එක කඩ කාමරයක් ඉතුරු වෙලා තිබුනා ටෙන්ඩර් කරලා ගත්තේ නැතුව. ඇත්තටම ඒ කඩ කාමරය ගත්තා ටෙන්ඩර් කළාට පසුව. ඒ පුද්ගලයා ඒකට මුදල් ගෙව්වේ නැහැ. ඒක නිසා නැවත ඒක ටෙන්ඩර් කරන්නට සිද්ධ වුනා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 14 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 15</u>**

**<u>ප්‍රසම්පාදන කමිටුවේ ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

**2023.02.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු හදිසි යෝජනා 01-04 දක්වා නිර්දේශ අනුමත කිරිමට යෝජනාකරමි.**

01.2023 වර්ෂයට අවශ්‍ය කාර්යාල උපකරණ (ලිපි ද්‍රව්‍ය) මිලදී ගැනීම සඳහා මිල ගණන් ලැබී ඇත. (ඒකක මිල)

| | විස්තරය | | ජේපර්ලයින් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් | ළහිරු කමියුනි කේෂන් | ගංගා බුක්ෂොප් | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව |
|---|---|---|---|---|---|---|
| 1 | කාබන් පෑන් (නිල්/කලු/රතු) | | 17.94 | - | (Atlas) 25.00 | - |
| 2 | A4 | 80GSM | 1,799.75 | - | 2,250.00 | - |
| 3 | | 70GSM | | - | 2,125.00 | - |
| 4 | ෆයිල් ටැග් | | (100 ක්) 201.25 | - | - | (1 ක්) 3.70 |
| 5 | සෙලෝටේප්-අඟල් 1 | | 86.25 | - | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | සෙලෝටේප්-අඟල් 2 | 175.95 | - | - | - |
| 7 | ෆයිල් කටු පෙට්ටි | 54.05 | - | - | - |
| 8 | ස්ටේප්ලර් කටු පෙට්ටි (24/6) | 65.55 | - | 65.00 | - |
| 9 | ස්ටෙප්ලර් කටු පෙට්ටි (23/10) | 175.95 | - | - | - |
| 10 | CR පිටු 40 පොත් | 96.60 | - | - | 112.00 |
| 11 | CR පිටු 80 පොත් | 184.00 | - | - | 189.00 |
| 12 | CR පිටු 120 පොත් | 253.00 | - | - | 262.50 |
| 13 | CR පිටු 160 පොත් | 339.25 | - | - | 381.50 |
| 14 | CR පිටු 200 පොත් | 419.75 | - | - | 462.00 |
| 15 | මුද්‍රිත ෆයිල් කවර | - | 37.00 | - | - |
| 16 | හයිලයිට් පෑන් | 96.60 | - | - | - |
| 17 | ටිපෙක්ස් | 131.10 | - | - | - |
| 18 | ගම් බෝතල් - කුඩා | 54.05 | - | - | - |
| 19 | බයින්ඩර් ගම් බෝතල් - කුඩා | 111.55 | - | - | - |
| 20 | බයින්ඩර් ගම් බෝතල් - ලොකු | 678.50 | - | - | - |
| 21 | තින්ත කුප්පි | 263.35 | - | - | - |
| 22 | මකන | 11.96 | - | - | - |
| 23 | A3 - ෆොටෝකොපි කොල | 3,898.50 | - | - | - |
| 24 | රෝනියෝ බණ්ඩල් | 2,081.50 | - | 1,750.00 | - |
| 25 | ක්ෂේත්‍ර සටහන් පොත් | 158.70 | - | - | 150.00 |
| 26 | ප්ලැටිග්නම් පෑන් | 31.99 | - | - | - |
| 27 | ටුවයින් නූල් බෝල | 138.00 | - | - | - |
| 28 | කතුරු | 142.60 | - | - | - |
| 29 | අඩිරූල් (අඩි 1) | 37.95 | - | - | - |
| 30 | පැන්සල් | 21.56 | - | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 31 | තීන්ත පෑඩ් | කුඩා | 86.25 | - | - | - |
| | | ලොකු | 372.60 | - | - | - |
| 32 | තීන්ත කුප්පි | | 263.35 | - | - | - |
| 33 | ස්ටික් නෝට් පෑඩ් | | 103.50 | - | - | - |
| 34 | බයින්ඩින් ටේප්-වර්ණ 4 (රතු/කොළ/නිල්/කහ) | | 262.20 | - | - | - |
| 35 | වැටුප් පරිගණක කොළ - 9.5*11- 1Ply | | 5,520.00 | - | - | - |
| 36 | වැටුප් පරිගණක කොළ - 11*15.5- 1Ply | | 8,395.00 | - | - | - |

***ලැබු මිල ගණන් අතරින් අවම මිල ගණන් යටතේ 2023 වර්ෂයට අවශ්‍ය කාර්යාල උපකරණ (ලිපි ද්‍රව්‍ය) මිලදී ගැනීම සඳහාත් කාබන් පෑන් සඳහා ගංගා බුක්ෂොප් වෙතින් ඉදිරිපත් කර ඇති “Atlas” පෑන් මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය විය.***

02.2023 වර්ෂය සඳහා කාර්යාලයට අවශ්‍ය සෞඛ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් ලැබී ඇත. (ඒකක මිල)

| | විස්තරය | විජේසිංහ එන්ටර්ප්‍රයිසස් ටූල්ශොප් | | පේපර්ලයින් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් | | ඉන්දික නිෂ්පාදකයෝ |
|---|---|---|---|---|---|---|
| 1 | රබර් අත්වැසුම් | Elbow Length | 470.00 | Small | 201.25 | |
| 2 | | Long | 370.00 | Large | 431.25 | |
| 3 | | Coated Cotton | 180.00 | | | |
| 4 | ටයිල් ක්ලීනර් | | | | 299.00 | 290.00 |
| 5 | නයිලෝන් කාණු බුෂ් | | | | 430.10 | 420.00 |
| 6 | බෝල කොසු (කොහු) | | | | 626.75 | 625.00 |
| 7 | වායු නැවුම්කාරක ඉසින (එයාර්ප්‍රෙෂ්නර්) | | | | 506.00 | 450.00 |
| 8 | සෝල්පැක්ස් | | | | | |
| 9 | පේපර් සර්වියට් | | | | 349.60 | |
| 10 | විම් කුඩු බෝතල් | | | | 143.75 | |
| 11 | ෆිනෝල් | | | | 395.60 | 390.00 |
| 12 | ඉදල් | සාමාන්‍ය | 400.00 | | 315.10 | 308.00 |
| 13 | | ප්ලාස්ටික් | 420.00 | | | |
| 14 | මුඛ ආවරණ | | | | 8.63 | |
| 15 | වැසි කබා | Jersey | 1,800.00 | | 2,817.5 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 16 | | (Top & Bottom) | 2,000.00 | | 0 | |
| 17 | සර්ජිකල් මුඛ ආවරණ | | | | 8.63 | |
| 18 | හාපික් | | | | 395.60 | 390.00 |
| 19 | මැසිනාශක | | | | | |
| 20 | කොසු (කොහු) | කොහු | 400.00 | | 488.75 | 385.00 |
| 21 | | ප්ලාස්ටික් | 380.00 | | | |
| 22 | රබර් ගම් බූට් | | 1,850.00 | B | 2,242.50 | |
| 23 | | | | W | 2,817.50 | |
| 24 | වැසිකිලි බුරුසු | | | | 166.75 | 160.00 |
| 25 | විෂබීජහරණ අත්සේදුම් දියර | | | | 694.60 | |

***ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් යටතේ 2023 වර්ෂය සඳහා කාර්යාලයට අවශ්‍ය සෞඛ්‍ය උපකරණ මිලදීගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය විය.***

03.ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීම සඳහා පොලිතීන් මිලදීගැනීම සඳහා මිල ගණන් ලැබී ඇත. (ඒකක මිල)

| විස්තරය | ප්‍රමාණය | නිව් නැෂනල් ට්‍රේඩර්ස් | ස්ටීල් ලංකා | නැෂනල් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| පොලිතීන් | 5 Kg | 1200.00 | 1250.00 | 1275.00 |

***ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් යටතේ " නිව් නැෂනල් ට්‍රේඩර්ස් " ආයතනය හරහා පොලිතීන් මිලදීගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය විය.***

04.සභා කාර්යාලයේ කැඩීගොස් ඇති ස්ථාන පිළිසකර කිරීම සඳහා වැඩකුලී සඳහා මිළ ගණන් ඉදිරිපත් වී ඇත. (ඒකක මිල)

| විස්තරය | එච්.පී. සිසිර සේනාරත්න | එෆ්.ජී.ග්ලාස් ඇන්ඩ් ඇලුමිනියම් | වරකාපොල ග්ලාස් හවුස් |
|---|---|---|---|
| වැඩ කුලිය | 19750.00 | 23000.00 | 22500.00 |

***ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් යටතේ " එච්.පී.සිසිර සේනාරත්න " හරහා පිළිසකර කිරීමේ කටයුත්ත සිදුකිරීමටත්, කාර්යය අවසන් වූ පසු මුදල් ගෙවීමටත් ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය විය.***

<u>ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 15 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 16</u>**

**<u>ප්‍රසම්පාදන කමිටුවේ ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

**2023.03.03 දින පැවති ප්‍රසම්පාදන කමිටු හදිසි යෝජනා 01-02 දක්වා නිර්දේශ අනුමත කිරිමට යෝජනා කරමි.**

01.සභාවට අයත් ZA-2382 බැකෝ ලෝඩරය සඳහා 12-15/80-18 ප්‍රමාණයේ ඉදිරිපස ටයර් 02 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් ලැබී ඇත. (ඒකක මිල)

| විස්තරය | ප්‍රමාණය | ආර්.එම්.ජී. ටයර් සර්විස් | නිෂාන් ටයර් සෙන්ටර් | සුමිඩැග් ටයර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් |
|---|---|---|---|---|
| 12-15/80-18 ටයර් | 02 | Rs. 97000.00 (CT) | Rs. 114000.00 (CEAT Tublus 12PR) | Rs. 67000.00 (GRI)<br>Rs. 97375.00 (PETLAS) |

***ලැබූ මිල ගණන් අතරින් වාහන නඩත්තු කමිටුව විසින් තීරණය අනුව තත්වය උසස් සහ වැඩි කල් පැවැත්මක් සහිත (මීට පෙර වැඩි කාලයක් භාවිතා කර ඇති ටයරයකි) සුමිඩැග් ටයර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ' වෙතින් "PETLAS" වර්ගයේ ටයර 02 ක් මිලදී ගැනීමට සහ මුදල් ගෙවීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය විය.***

02.මාහේන ජල යෝජනා ක්‍රමයේ වතුර පෙරන පිල්ටරයට අවශ්‍ය වැලි කියුබ් 01 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් ලැබී ඇත. (ඒකක මිල)

| විස්තරය | ප්‍රමාණය | ඩී.ඩී.එස්. හාඩ්වෙයාර් | ඩී.ආර්.කේ. කන්ස්ට්‍රක්ෂන් | කුමාර ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ |
|---|---|---|---|---|
| වැලි කියුබ් | 01 | 22800.00 | 22000.00 | 23000.00 |

***ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් යටතේ " ඩී.ආර්.කේ. කන්ස්ට්‍රක්ෂන් " වෙතින් වැලි කියුබ් 01 ක් මිලදී ගැනීමට සහ මුදල් ගෙවීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය විය.***

<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 16 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 17**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2022.12.06 දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතා සඳහා මිලදී ගත් 1*4 ප්‍රමාණයේ බෝක්කු බට 49 සහ 1.5*4 ප්‍රමාණයේ බෝක්කු බට 33ක ප්‍රමාණය ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් මාස 06ක් ඇතුලත එම මිල ගණන් යටතේ ඉන් අඩක් මිලදී ගැනීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

ටෙන්ඩර් කරපු විට මාස 06ක කාලයක් වලංගුයිනේ. පසුගිය මිල ගණන් වලට ඒ සැපයුම්කරු දෙන්න කැමති නම්, මාස 06ක් මිල ගණන් වලංගු නිසා ඒ ඇනවුම් කරන කොටසින් බාගයක් අපට ගන්න පුළුවන් නීත්‍යානුකූලව. ඒ අනුව ලක්ෂ 10ක් වෙන් කරලා තිබුනා ලක්ෂ 10 ගන්නේ නැතුව ලක්ෂ පහක ප්‍රමාණය ගන්න සුදුසුයි කියලා තමයි මේ යෝජනාව දැම්මේ.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 17 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 18**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභා මුර කාමරය සහ රථ නැවතුම්පල සඳහා නව විදුලි සැපයුමක් ලබා දීමට අවශ්‍ය බැවින් විදුලි උපාංග මිලදී ගැනීම වෙනුවෙන් එම විදුලි උපාංග ගබඩාවට සත්‍යය වශයෙන් ලැබී ඇති බැවින් බිල්පත් අංක 3461ට අදාලව සංජය ඉලෙක්ට්‍රිකල්ස් වෙතට රු.51,918.00ක මුදල ගෙවීමට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

පල්ලේ මුර කුටියේ ප්‍රශ්නයක් ආවා. කාර්යාලය ඉදිරි පිට මුරකුටියේ ඉන්නේ නැතුව රථවාහන තිබෙන ස්ථානයේ ඇති ගොඩනැගිල්ල මුර කුටියක් ලෙස යොදා ගෙන ඉන්න ලැහැස්ති කලා මොකද කාර්යාල ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති මුරකුටියේ ඉදලා මෙහාට එන විට මේවා ඔක්කොම ගලවාගෙන ගිහිල්ලා.මෙතන රකින්න ගොඩක් දේවල් නැහැ. ඒ නිසා මුරකරු වාහන තිබෙන ස්ථානය රකින්න ඕනේ නිසා මෙතන රදවන්නයි මෙතන වයරින් කරලා දමන්නට තමයි මේ යෝජනාව දැම්මේ.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 18 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 19**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2013 හා ආයතන සංග්‍රහයේ xxi පරිච්ඡේදයට අනුව ප්‍රාදේශීය සභාවේ නිළ ඇඳුම හිමි සේවක මහත්ම මහත්මීන් 55ක් සඳහා 2023 වර්ෂයට අදාල රු. 4000.00 බැගින් නිළ ඇඳුම් ලබාදීමේ දීමනාව ලබා දීමටත් රු 220,000.00ක මුළු මුදල ගෙවීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.බී. මොහොමඩ් ෂරීප් මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 19 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 20**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සභාවට අවශ්‍ය විථීපහන් අලුත්වැඩියා/සවිකිරීමට අවශ්‍ය විදුලි උපාංග මිලදී ගැනීම වෙනුවෙන් එම විදුලි උපාංග ගබඩාවට සත්‍ය වශයෙන් ලැබී ඇති බැවින් බිල්පත් අංක 3471ට අදාලව සංජය ඉලෙක්ට්‍රිකල්ස් වෙතට රු.5,037,225.00ක මුදල ගෙවීමට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 20 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 21**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

සභාව සතු LL-7091 ඩ්‍රම් ට්‍රක් රථයේ ටයරයක් හදිසියේ පුපුරා යාම හේතුවෙන් ඒ සඳහා 900*20 ප්‍රමාණයේ ටයරයක් සබරගමුව පළාත් නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙතින් මුදල් ගෙවා මිලදී ගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

900*20 (සියැට්) ටයර් 01 - රු97650.00

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 21 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 22**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

සිතුමිණ,ඉහලගම,අල්ගම ලිපිනයේ පදිංචි කේ.පී.උපාලි අමරසිරි ජයතිස්ස යන අය විසින් මිල්ගෝ ආයතනය මඟින් අලෙවිසැලක් ඇවිදින මංතීරුව හා ළමා උද්‍යානය තුල පවත්වාගෙන යාමට ඉල්ලීමක් කර ඇත. ඒ අනුව තමන් විසින් ස්ථානයක් සකස් කර ගැනීමට කටයුතු කල යුතු බවත් ආදායම් පරීක්ෂක වාර්ථාවක් ලබාගෙන ඒ අනුව දෛනිකව බදු මුදල් අයකර එය ලබා දීම සුදුසු බවත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 22 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 23**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල නගර මධ්‍යයේ දැනට ස්ථාපිත කර ඇති ඇවිදින මංතීරුව, ළමා උද්‍යානය හා පොදු පහසුකම් මධ්‍යස්ථානය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු ප්‍රදර්ශන නාම පුවරු දෙකක් රංගන හෝටලය හා අගුරුවැල්ල මංසන්දිය අසල ප්‍රදර්ශනය කිරීම සුදුසු බැවින් එම නාම පුවරු දෙක සකස් කර සවි කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 23 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 24**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් සකස් කර එවා ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැළසුම්, ඉඩම් අනු බෙදුම සැළසුම් හා ගොඩනැගිලි සැළසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වරකාපොල බල ප්‍රදේශය තුළ බලාත්මක කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්..බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා, ගරු මන්ත්‍රි ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා, ගරු මන්ත්‍රි එස්.ආර්.කේ.ලොකුගලප්පත්ති මැතිතුමා, ගරු මන්ත්‍රි අයි.පී.අජිත් ගුණපාල මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.ටී.ආනන්ද කරුණානායක මැතිතුමා, විපක්ෂ නායක එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.ටී කරුණාදාස ලෙනගල මැතිතුමා,යන අයගෙන් සමන්විත කමිටුවේ ගන්නා වූ නිර්දේශ වලට අනුව වරකාපොල බල ප්‍රදේශය තුළ බලාත්මක කිරීම සඳහා මෙම යෝජනාව ස්ථිර කරමු.

නාගරික සංවර්ධ අධිකාරියට ගැසට් කරන ලද ප්‍රදේශ වලින් බැහැරව කරන ලද ඉදිකිරීම් සඳහා අතුරු ව්‍යවස්ථාක් හදලා තිබෙනවා. මේ අතුරු ව්‍යවස්ථාවට සංශෝධනත් දෙන්න කියලා මෙහි සඳහන් කර තිබෙනවා. අපට එහෙන් එන එකම අපි වැළඳ ගන්න ඕනේ නැහැ. මේ සභාවාරය තුළදීම මේක අනුමත කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මොන වෙලාවෙත් මේ නාගරික සංවර්ධන අධිකාරිය කියන ආයතනය වරකාපොල බල ප්‍රදේශය තුළ නාගරික සංවර්ධන අධිකාරිය හරහා කරපු දෙයක් අපට නැහැ .පසුගිය කාල සිමාව තුල රණතුංග සභාපතිතුමත් ඉන්න කාලයේ ප්‍රාදේශීය සභාවේ ලක්ෂ 7ක් දීලා ගොඩ කරපු, පස් පුරවපු ඉඩම් අත්පත් කරලා ගත්තු කොටස නාගරික සංවර්ධන අධිකාරිය ගත්තා. නමුත් ආදායම් ලබා ගෙන යනවා මිසක් වරකාපොලට නාගරික සංවර්ධන අධිකාරියෙන් සත පහක වැඩක් වුණේ නැහැ. දැනටත් මේ කරන්න යන්නේ ගරු මනෝ විජේරත්න ඇමතිතුමා ඉන්න කාල සිමාවේදී අල්ගම නගරය සංවර්ධනය කිරීම සඳහා සැළැස්මක් අඳින්න කිව්වා. වාරියගොඩ නගරයටත් සැළැස්මක් අඳින්න කිව්වා.නෙළුන්දෙණියටත් සැළැස්මක් අඳින්න කිව්වා. මේ සැළැස්ම ඇඳීමේ පරමාර්ථය තමයි නාගරික සංවර්ධන අධිකාරියෙත් තිබුණේ. මේ සැළසුම් ගණනාවක් සැලසුම කළා.එක සැළැස්මක් වත් ක්‍රියාත්මක වුනේ නැහැ. අල්ගම, වාරියගොඩ, නෙළුන්දෙනිය කියන නගරවල සැලසුම් එකක් වත් ක්‍රියාත්මක වුණේ නැහැ. අද වරකාපොල බස් නැවතුම්පොලෙහි පමණක් කඩහිමියන්ගෙන් ගන්න මුදල් ප්‍රමාණය බැලුවොත් අපේ සල්ලි අරගෙන ගිහිල්ලා කොළඹ සංවර්ධනය වෙනවා මිසක් නාගරික සංවර්ධන අධිකාරියෙන් වරකාපොල ග්‍රාමසේවා වසම් 78යි ගම් 225යි, කුඩා නගර 04ක් තිබෙනවා. එක නගරයකට වැසිකිලියක් හැදුවද කියලා අහන්නකෝ මේ නාගරික සංවර්ධන අධිකාරිය. නැවත වරක් මේ ප්‍රාදේශීය සභාව තුළ ගන්නේ කුඩා නගර තුළ නිවාස අනුමත කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියට අපි යම් මුදලක් ගෙවන්න ඕනේ. අතුරු ව්‍යවස්ථාව සම්මත කරලා අපිට දානවා යම් කිසි මුදලක් අපට දෙන්න කියලා. ඒකේ අත්දැකීමක් තිබෙනවා පසුගිය කාල සීමාවතුල ඔබතුමාට මතක ඇති නාගරික සංවර්ධන අධිකාරිය යම් කිසි කාල සීමාවක තිබෙනවා බලයක්. ඒ බලය තුළදී ඒ අය තමයි මුදල් හොයා ගත්තේ.වරකාපොල නගරයේ මුදල් ප්‍රාදේශීය සභාවට ලැබුනේ නැහැ. අපි ඇයි මේ අපේ දේපළ අපේ සම්පත් ටික නාගරික සංවර්ධන අධිකාරියට දීලා ඉදිරි අනාගතයේදී අපි මේ ව්‍යවස්ථාව සම්මත කරලා දීලා ප්‍රාදේශීය සභා දීලා පළාත් සභා දිලා කුඩා නගරයක්, කුඩා පාර්ලිමේන්තුවක්, ප්‍රාදේශීය සභාවක් ලෙස අනාගතයේ කවුරු හෝ දේශපාලන අධිකාරියක් මෙතනට එනකොට. යම් කිසි වැඩක් කරන විට නීතිමය රාමුවෙන් අපි බැදිලා තිබෙනවා නිසා අපට එතනට යන්න බැහැ. ඒ අයගේ පස්සෙන් තමයි අපටත් එතනට යන්න සිදු වෙන්නේ. යම් කිසි සංවර්ධනයක් කරලා තිබෙනවා නම්, ප්‍රශ්නයක් නැහැ. අනාගතයේදී අපි යම් කිසි මුදලක් හොයාගෙන වාරියගොඩ, අල්ගම, නෙළුන්දෙණිය, සුළු නගර සංවර්ධනය කරන විට අප නැවත වරක් යන්න ඕනේ ඒ ඉදිකල ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරියේ ආදායම් බවට පත් වෙනවා. ගිය වර සභාපතිතුමා සභාවේදී කතා කලා කඩ ටික අපේ සභාවට දෙන්න. අපි සභාවෙන් පාලනය කරලා දෙන්නම් කියලා. අපට ඒ අය දුන්නේ නැහැ. අපිට දිලා අපට කිව්වා නම් යම් කිසි මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට දෙන්න කියලා එහෙම වුනත් කමක් නැහැ අපි මේ කුණු ටික අදින්නත් ඕනේ අපි මේ නගරයේ කුණු ටික අදින්නත් ඕනේ.එතකොට අපට ආදායම් ලබා ගන්න පුළුවන් ක්‍රමවේදය අපි මේ ඔක්කෝම දීලා අපට අත හෝදාගෙන බලා ගෙන ඉන්න වෙනවා. ඒ නිසා අපි ගොඩාක් දුරට කල්පනා කරලා කමිටුවක් දමලා අපි මේක අධික්ෂණය කරන්න ඕනේ. නාගරික සංවර්ධන අධිකාරියේ අතුරු ව්‍යවස්ථා මොනවාද ඉදිරි අනාගතයේදී මේ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා අපට බලය නැති වෙනවා. ඒ නිසා සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය කියන තැනට අපි යන විට ටිකක් පරිස්සමින් යන්න ඕනේ. මේ මුදල අපට ලැබෙනවා නම් කමක් නැහැ. මේ මුදල් වෙන කොහාට හරි යනවා අපේ නගර සංවර්ධනය වෙන්නේ නැහැ. ඒ නිසා කමිටුවක් දාලා මේ ව්‍යවස්ථාවේ බලලා කතා කරමු.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

තවත් දෙයක් කියන්න ඕනේ ගිය මාසයට ඉස්සරලා මාසයේ ලියුමක් එවනවා යූ.ඩී එකයි අපි එකට ගිණුමක් ආරම්භ කරන්න ඕනේ කියලා. ගැසට් කළාට පස්සේ නිවාස සංවර්ධන අධිකාරියේ මුදල අර ගිණුමට දමන්න ඕනේ. ඒ ගිණුමේ මුදල් ටික එයාලත් එක්ක එකතු වෙලා අපි ගන්න ඕනේ. මං කිව්වා ගන්නේ නැහැ. අපි අනුමත කළේ නැහැ කියලා.අපේ තිබෙන ආදායම් මාර්ග වෙන ආයතන විසින් බලහත්කාරයෙන් ලබා ගන්න හදන්නේ.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 24 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 25</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් නව නගරශාලා ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු වලදී කොටස් වශයෙන් අදියර හතරකින් ගෙවීම් කරන ලදී.

මෙම කොටස් ගෙවීම් වලට අදාල රැඳවුම් කාලය ඉක්ම වී ඇති බැවින් එම රැඳවුම් මුදල් ලබා දෙන ලෙස එහි කොන්ත්‍රාත්කරු වන කෑදරාගම කන්ස්ට්‍රක්ෂන් වෙතින් කරන ඉල්ලීම අනුව එහි රැඳවුම් මුදල වන රුපියල් 2,062,667.52 ක මුදල පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය වන තෙක් සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි

**<u>ගරු මන්ත්‍රී ආර්.ආර්. එම්.පී.රාජකරුණා මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 25 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ-26</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

2022.10.11 දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ පොදු පහසුකම් මධ්‍යස්ථානය සඳහා මිලදී ගත් ටිකට් පොත් ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බැවින් මාස 06ක් ඇතුලත එම මිල ගණන් යටතේ ඉන් අඩක් මිලදී ගැනීමට සුදුසු බවට මම මෙම සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ආර්. එම්.පී.රාජකරුණා මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 26 යටතේ 2023.03.07 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**උ-01**
**ඒකාබද්ධ ලැබීම්/ ගෙවීම් සාරාංශය**

**ගරු සභාපති එන්. සරත් සුමනසූරිය මැතිතුමා**
2023 පෙබරවාරි මස ලැබීම් ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු යැයි යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***(2023 පෙබරවාරි මස ලැබීම් ගෙවීම් වාර්තාව 2023.03.07 මහා සභාවේ තීරණ අංක උ-01 යටතේ ඒකමතිකව සහා සම්මත විය)***

**උ- 02 -01**
**පවත්නා ගෙවීම් සාරාංශය**

**ගරු සභාපති එන්. සරත් සුමනසූරිය මැතිතුමා**
2023 මාර්තු මස පවත්නා ගෙවීම් පිළිගැනීම සුදුසු යැයි යෝජනා කරනවා.

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් 251-1929 ඩබල් කැබ් රථය සඳහා 215*70*16 ප්‍රමාණයේ ටයර් 4ක් සවි කිරීම වෙනුවෙන් වන රු174400.00 ක මුදල ආර්.එම්.ජී.ටයර් සර්විස් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***(පවත්වා ගෙවීම 2023.03.07 මහා සභාවේ තීරණ අංක උ-02-01 යටතේ ඒකමතිකව සහා සම්මත විය)***

**උ- 02 -02**

**ගරු සභාපති එන්. සරත් සුමනසූරිය මැතිතුමා**
2023 මාර්තු මස පවත්නා ගෙවීම් පිළිගැනීම සුදුසු යැයි යෝජනා කරනවා.

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් RV-2780/ 67-0127 ට්‍රැක්ටර් ට්‍රේලර් යකඩ තහඩු යොදා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් වන රු.100000.00ක මුදල උපාලි මෝටර්ස් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***(පවත්වා ගෙවීම 2023.03.07 මහා සභාවේ තීරණ අංක උ-02-02 යටතේ ඒකමතිකව සහා සම්මත විය)***

**<u>වෙනත් කරුණු</u>**

**<u>එ 01-(1)</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා</u>**
අද දින මහා සභාවට නොපැමිණි නිවාඩු ලබා ගැනීමට ඉල්ලා ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම.**

| | |
|---|---|
| එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| එම්.පී.නිරෝෂණී වර්ණකුල මැතිනිය | ගරු මන්ත්‍රී |
| පී.සරත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| ඩබ්.රවිඳු ප්‍රභාත් සිං ජයරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |

**<u>ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
අද දින නොපැමිණි මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා වෛද්‍ය වාර්තාවට යටත්ව නිවාඩු ලබා දීම සුදුසුයි කියලා මම මේ අවස්ථාවේ කියා සිටිනවා.

***(ඒ අනුව මෙම යෝජනාව තීරණ අංක එ 01-(1) යටතේ 2023.03.07 වන දින පැවති මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.)***

**<u>එ 01-(11)</u>**

**<u>ගරු මන්ත්‍රී එම්.බී.එම්.ෂරීප් මැතිතුමා.</u>**
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමනි,තුමියනි, මේ වචනය මගෙ කටින් එන්න හොඳ නැහැ. නමුත් ගරු සභාපතිතුමා කිව්වා වගේ අපි සියලු දෙනාම ප්‍රාර්ථනා කරන්නේ පුළුවන් නම් දීර්ඝ කරලා ගමනක් යන්න තමයි අපි සියළු දෙනාම බලාපොරොත්තු වෙන්නේ. නමුත් පනතට අනුව අවුරුදු පහක කාල සීමාවක් වෙනවා මේ වන විට

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
ඔබතුමා හිටගෙන ඉන්න. මම තව ඌන පූර්ණයක් දෙන්නම් මේක දීර්ඝ කරන්න ක්‍රමයක් තිබෙනවා. නීත්‍යානුකූල ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි පළාත් පාලන මැතිවරණ ආඥා පනතේ 84 වගන්තියට අනුව මෙවැනි තත්වයක් තුළ කියන්නේ මැතිවරණයක් පවත්වන්න බැරි තත්වයක් තුළ ගැසට් නිවේදනයක් මඟින් කල් දමන්නට පුළුවන්.අනික් එක කියන්නේ නැහැ.බලමු ඉතින්.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.එම්.ෂරීප් මැතිතුමා.</u>**
අපි කවුරුත් හිතුවේ නැහැනේ 133න් අගමැතිවරයෙක් ජනාධිපති වෙනවා කියලා. සර්ව ජන ඡන්දයෙන් තමයි ජනාධිපතිවරයෙක් පත් වෙන්නේ. නමුත් අපි කවුරුත් බලාපොරොත්තු නොවූ ලෙස ජනාධිපතිවරයෙක් පත් වෙනවා. අපි දන්නවා පසුගිය කාල සීමාව තුළදී මගේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු අහනවා ඡන්දයක් තියනවාද තියනවාද කියලා.මම කිව්වා නෑ, නෑ,නෑ කියලා.මම කිව්වා ජනාධිපතිවරයෙක් පත් වෙනවා කියලා. මම ඇහුවා කොහොමද පත් වෙන්නේ කියලා.කොහොම හරි පනතින් පත් වෙනවා කියලා කිව්වා. සභාපතිතුමත්

මේ පෙන්නුම් කරලා දුන්නේ පනතට අනුකූලව කාල සීමාව නැති වුනත් අලුත් ක්‍රමවේදය අනුගමනය කරලා මේ වාතාවරණයත් එක්ක මැතිවරණයක් පවත්වාගෙන යාමට නොහැකි නිසා මැතිවරණ කොමසාරිස්වරයා, රජය හා පක්ෂ ආයතන ඉදිරිපත් කරන විට නොයෙක් නොයෙක් කරුණු කාරනා පෙන්වා දි තිබෙනවා. මෙතනදීත් මේ කොයි කොයි ආයතන වේවා ඡන්දයක් තියන්න ඕනේ කිව්වොත් ප්‍රජාතන්ත්‍රවාදය තුල ඡන්දයක් තියන්න ඕනේ. අපි ලැහැස්තියි. අපි සූදානම්. අපි සූදානම් කියන කොට වෙනත් ආයතනයකින් කියනවා හරි අපි මුදලුත් දෙනවා කියන ක්‍රමවේදයක් තමයි තිබෙන්නේ. බැහැ කියන්නේ නැහැ කවුරුවත් බැහැ කියන්න බැරි ක්‍රමවේදයක් තමයි තිබෙන්නේ. කාල සීමාවත් ඉක්මවා ගිහිල්ලා. නමුත් මේ දින වලදි කාලය දීර්ඝ වුනොත් අපි සතුටු වෙනවා. අපි අවුරුදු පහක් මේ සභාවේ හිටියා. ලොකු සේවාවක් කලා. අපි අතර නොයෙක් නොයෙක් ප්‍රශ්න තිබුනත් අපි සභාවට එන මොහොතේදී අපි එළියේදී මෙහෙම කරමු මෙහෙම කරමු කිව්වත්, සභාපතිතුමාගේ වචන වලට එකග වෙලා අපි ඔක්කොමලා මේ පොදු කටයුතු ආරම්භ කරගෙන ගියා. ඒ වාගේ සහෝදරත්වය තිබුනා. සභාවේ යම් කිසි ප්‍රතිපාදන ලැබෙනවා නම්, ඒ ප්‍රතිපාදන ලබා දීලා ඒ වැඩ කරගෙන යනවා. පෞද්ගලික දේවල් සභාපතිතුමත් එක්ක කතා කරලා උදවු උපකාර ගත්තා. සභාපතිතුමා කාට හෝ අසනීප වුනා නම්, මෙයාට අසනීපයි මොකක් හෝ කරන්න ඕනේ කියලා වැඩ කටයුතු කළා. අද මම කතා කරන්න බලාපොරොත්තු වුනේ අද සමහර වෙලාවට අවසාන සභා වාරයක් වුනොත්, එසේ නොවේවා කියා ප්‍රාර්ථනා කරනවා. අපි සියළු දෙනාම සහෝදරයෝ වගේ කාලයක් ගත කලා. මට හැමදාම ආණ්ඩු පක්ෂයෙන් කතා කරන්නේ අපේ විපක්ෂ නායකතුමා කියලා තමයි කතා කරන්නේ. මම ආඩම්බර වෙනවා. කවදාවත් මම මුස්ලිම් පුද්ගලයෙක් කියලා එහෙම සැළකුවේ නැහැ.මාත් එක්ක විහිළු තහළු කරලා හිටියා. අපි ඔක්කොම එකා වගේ හිටියා. පක්ෂ භේදයකින් තොරව අපි කටයුතු කළා. මට පුළුවන් හැම දේම මම කලා. මාත් එක්ක සියළු දෙනාම සහෝදරයෝ වගේ හිටියා. අපේ පකෂයේ කණ්ඩායමත් එක්කත් අපි සහෝදරයෝ වාගේ හිටියා. ඉදිරි අනාගතයේදී මේ සහෝදරත්වය අපි ළග තිබෙන්නට ඕනේ. යම් කිසි කරදරයක් වුන විට අපි ඔක්කොම එකතු වෙන්න ඕනේ. අපි මිත්‍රත්වයෙන් ඉන්න ඕනේ. අපි කාගේ කාගේ වැරදි තිබුණත් මේ වෙලාවේ සමාව අයදිමින් ඒ වාගේම මේ සභාව කාල සීමාව තුළ විශාල සේවාවක් කළා. මේ සේවාව කිරීම සඳහා ආණ්ඩු පක්ෂය හා විපක්ෂ කියලා හිටියේ නැහැ. විපක්ෂ නායකවරයා හැටියට ගමේදී හෝ නගරයේදී කොතනකදී වේවා යම් කිසි උදවුවක් අවශ්‍ය වුනොත් අපි ඒක කරන්න ඕනේ.අපි වාසනාවන්ත පුද්ගලයෝ. සභාවේ දීර්ඝ කාලයක් අවුරුදු පහක් අපට ඉන්නට ලැබුනා.මම හිතන විදිහට අවුරුදු පහක කාල සිමාව තුල විශාල සේවාවක් කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු නැති සේවාවක් කරලා තිබෙනවා. සුළු නගර සභා කාලයේ ඉදලා මෙතෙක් බැලුවොත් පසුගිය කාල සීමාවට වැඩිය මෙතෙක් බැලුවහොත් මේ සැසිවාරයේ නව වැඩපිලිවෙළවල් සකස් කළා. ඒ වාගේම අපට චෝදනාත් ආවා. නගර ශාලාවේ වැඩ ටිකත් නිම කරන්නට මුදල් ලබා ගන්න හැකියාව ලැබෙන්න ඕනේ. මොනවා වුනත් නව වැඩපිළිවෙළක් ඉදිරියේදී එන විට අපට අතපසු වූ මේ ගොඩනැගිලි දෙකත් නිමාවට පත් කරන්නට මුදල් ලබා ගෙන නිම කරන්නට අවස්ථාව ලැබෙන්නට ඕනේ. මගෙන් යම් කිසි වරදක් වුනා නම් මම මේ අවස්ථාවේ සමාව අයැද සිටිනවා. ඒ වාගේම ප්‍රාර්ථනා කරනවා නැවත වරක් මේ මන්ත්‍රී මණ්ඩලය අපිත් එක්ක එකතු වෙලා ඉදිරියේ මේ කටයුතු කරගෙන යන්නට හැකියාව ලැබේවා කියා. මම හිතන්නේ නැහැ 19 වෙනිදා අවසන් වේවි කියා. සභාපතිතුමා පෙන්නුම් කළා. සභාපතිතුමයි මන්ත්‍රිවරුන්ටයි කරන්නට බැරි එක කොමසාරිස් පාලනයක් ඇවිල්ලා මේ පරිපාලනය අඩපණ වෙයි කියලා හිතනවා. ඒ නිසා තමයි ගරු සභාපතිතුමා හෙට සාකච්ඡාවෙදිත් අගමැතිතුමා හමුවෙලා කතා කරලා, පළාත් පාලන ආයතන වල දේශපාලඥයන් නැති නම් දේශපාලනය කරන්න බැහැ. මම හැමදාම ප්‍රාදේශීය සභාවට ආවේ සතුටින් .මම මේකේ රැදිලා ඉන්නවා කියලා පරමාර්ථයක් තිබුණේ නැහැ. මටත් අවුරුදු 63ක් වුනා විශාල සේවාවක් වුනා. අපි දැන් ධර්මාණුකූලව ජීවත් වෙන්න ඕනේ මිනිස්සු. අපි මෙතනට එන විට කවුරුත් විහිළු තහළු කරලා කතා කරනවා.මේක අවසාන කාල සීමාව වුනොත් මේ මන්ත්‍රී මණ්ඩලයේ අපි කොහොම හරි සම්බන්ධ වෙලා කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ටී.කරුණාදාස ලෙනගල මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමනි, උප සභාපතිතුමනි සියලුම මන්ත්‍රීතුමනි මන්ත්‍රීතුමියනි අද 2023 මාර්තු 07 වැනිදා. වරකාපොල ප්‍රාදේශීය සභාව නිර්මාණය කරලා 1991 ජුනි 10 වෙනිදා වෙනකොට අවුරුදු 33 ක කාල සීමාවක් වෙනවා. මෙම කාලය සීමාව තුළ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නට ලැබිලා මං වගේම අපේ උපසභාපතිතුමා ඉන්නවා අතිවිශාල කාල සීමාවක් තුළ හැකි පමණ කටයුතු කරලා තිබෙනවා සංවර්ධනය පැත්තෙන්. ඒ ආරම්භයේ සිට මේ දක්වා වරකාපොල ප්‍රාදේශී සභාවේ වැඩිම නියෝජිත සංඛ්‍යාවක් තිබෙන්නේ මේ කාල සිමාවේ. අපි 2018 වෙනකම් මේ සභාව නියෝජනය කලේ මන්ත්‍රීවරු 22යි. අද වෙන විට 43යි. ඒ ඒ පනත් අනුව. සමහර විය බොහෝ දෙනෙක් දන්නේ නැහැ. ලංකාවේම ප්‍රාදේශීය

සභාවල පළමුවෙන්ම නාම යෝජනා දුන්නේ කවදද කියලා. පළමුවෙන්ම ප්‍රාදේශීය සභා මැතිවරණය සඳහා නාම යෝජනා කැදවලා තිබෙන්නේ 1988 වර්ෂයේ. මේක බොහෝ දෙනෙක් නොදන්න දෙයක්.මේකේ නාම යොජනා භාර අරගෙන වැඩි දවසක් යන්නට පෙර ජනතා විමුක්ති පෙරමුනේ දෙවැනි මාරක අරගලය පටන් අරගෙන තිබුණේ. ඒ නිසා එම මැතිවරණයේ නාම යෝජනා අවලංගු කරලා දමලා , කාලයක් දුන්නා 1991 වෙනකම්. නමුත් මේ ප්‍රාදේශීය සභා මැතිවරණය තුළට නාම යෝජනා දීලා නිතරගයක් තිබුන ප්‍රාදේශීය සභාවක් තිබුනා ලංකාවේ. ඒක තමයි පොළොන්නරු දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා ව.ඒක නිර්මාණය කළේ ප්‍රාදේශීය සභා ඉතිහාසයේ පළවෙනි එක ලෙස තනි පක්ෂයක් ලෙස එක්සත් ජාතික පක්ෂය තරඟ කරලා තමයි ඒ ජයග්‍රහනය ලැබුවේ. ඒක අවසන් වුණෙ නැහැ, ඊට පසුව මැතිවරණ වලදීත් මේ පසුගිය කාලය වෙනකම් ඒ අයගේ අවුරුදු හතරේ කාල සීමාව අපට වඩා වෙනස් වෙලා තිබුණා. මේක බෙන්තර. ඇල්පිටියටත් සිදු වෙලා තිබෙනවා. ඒ වගේ සිද්ධියක් නිසා. මං මේක කිව්වේ තමුන්නාන්සේලාට මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා මාසෙකට දවස් දෙකක් මේකේ සැරිසරලා සංවර්ධනය කියන දේ සඳහා සභාපතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලයෙන් මුදලක් සම්මත කර දීලා පාරක් හදන එක වත්, ළිඳක් හදන එකවත් වෙනත් සංවර්ධන ක්‍රියාදාමයක් කරන එක නෙවෙයි පළවෙනි දේ. තමන්ගේ ගම් ප්‍රදේශය තුළ මේ සංවර්ධන ක්‍රියාදාමය වාගේම මිනිසුන් තම කාලය ගත කරමින් ඊළග අවස්ථාවටත් තරඟයකින් තොරව යන්න පුළුවන් තත්වයකට තමන්ගේ මහජන සේවාව ආරක්ෂා කර ගන්නවා නම් ඒක තමයි ඔබතුමන්ලාට තිබෙන ලොකුම දේ. මගේ බලාපොරොත්තුවක් නැහැ. මේ ගමන නාම යෝජනා දීලත් නැහැ, මේ 33න්ම මං ඉවත් වෙන්න තමයි හිතාගෙන ඉන්නේ. ඒකට හොඳ උදාහරණයක් තමයි ඉස්සරහින් වාඩි වෙලා තිබෙන්නේ. උප සභාපතිතුමා 1991 ජුනි මාසයේ 10 වෙනිදා නගර ශාලාවේ තමයි පළමු රැස්වීම තිබ්බේ. කිසිම පහසුකමක් තිබුණෙ නැහැ. අපි 23 දෙනා එකතු වෙලා. එක්සත් ජාතික පක්ෂයේ 13 දෙනෙක් හිටියා.අනෙක් නව දෙනා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අරඹම කලා. නමුත් 13 කියන එක එක්සත් ජාතික පක්ෂයට බොහොම නරක එකක්. .1991 13 දෙනෙකුගෙන් පත් වෙලා සභාපතිවරයා අබේ මහත්තයා පත් වන කොට, අපේ තිස්ස සමරසිංහ මහත්තයා උපසභාපති බවට පත් වුනා. මාස 06ක් යනකම් සෑමදාම කලබල. විපක්ෂයෙත් කලබල ආණ්ඩු පක්ෂයෙත් කලබල. 13 නරකයි. මෙදත් මේක වෙලා තිබෙනවා.මෙදත් එක්සත් ජාතික පක්ෂයේ 13යි. අද වෙනකොට ඒක කැඩිලා තිබෙන්නේ කැළි ,කැළි වලට. මම ඉතිහාසය ගැන කිව්වේ 13 නරක ඉලක්කමක්. ඒ වාගේම මතක් කරන්න ඕනේ මේ කාල සීමාව තුළ අබේරත්න මහත්තයාගෙන් පටන් අරගත්ත සභාපති ධුරය මේ වන විට එක්සත් ජාතික පක්ෂයෙන් තුන් දෙනයි, පොදු පෙරමුණෙන් තුන් දෙනයි.දැනට එක්සත් ජාතික පක්ෂයෙන් දෙදෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි මේ කාල සීමාව තුළ ලේකම් වරු 1991 සිට මේ දක්වා පුරුෂ පක්ෂයෙන් හතර දෙනෙකුත් ස්ත්‍රී පක්ෂයෙන් පස් දෙනෙකුත්. 1991 වරකාපොල ප්‍රාදේශීය සභාවේ ආදායම් ප්‍රමාණය ලක්ෂ 55යි. මං හිතනවා අයවැය ලේඛණයක් උප සභාපතිතුමා ළග තිබෙයිද කියලා. ඒකෙන් පැහැදිලිව පෙනෙනවා, මේ වසර 33ක කාල සීමාව තුළ සියලුම සභාපතිවරු, උප සභාපතිවරු, විපක්ෂනායකවරු ඒ සමාජික පිරිස තමන්ගේ ප්‍රදේශය දියුණු කිරීම සඳහා ක්‍රියාකාරිත්වයක් ලබා ගෙන තිබෙනවා. මං ඒක අත්දැක්කා. අබේරත්න මහතා කියන්නේ ඉතාමත්ම හොඳ ඒ වාගේම කඩිසර පුද්ගලයෙක් . නමුත් සභාවේ සිටිනවා අඩුයි. ඒ අනුව බලන විට අපේ සභාපතිතුමා දවස් හතම මෙහි සිටිනවා. ඒකත් වැදගත් මොකද ප්‍රධාන පාලකයාට වගකීමක් තිබෙනවා සමස්ත ජනතාව වෙනුවෙන් ඡන්දය දුන්නා හෝ නොදුන්නා හෝ අවස්ථා වෙනුවෙන් එතුමා තමන්ගේ වගකීම ඉෂ්ඨ කළා. එදා සිට අද දක්වා අපි ලොකු ගමනක් ගිහිල්ලා තිබෙනවා. ඒ ගමන තුල විශාල අපහසුතාවයකට පත් වෙලා තමයි මෙතුමා ඉන්නේ. හේතුව එතුමා බොහෝ කාල සීමාවක් ගත කරලා අලුත් අලුත් දේවල් ගෙනල්ලා මේක නිර්මාණය කරන්න ඕනේ කියන හැඟීමක් තිබෙනවා. සමහර කණ්ඩායම් මේකට විරුද්ධ වෙනවා. සමහර කණ්ඩායම් මේකට බනිනවා. ඒක ස්වාභාවික දෙයක්. ඕනෑම කෙනෙකුට බැනුම් අහන්න පුළුවන්. ඩඩ්ලි සේනානායක මැතිතුමා 1936 සිට මේ දැදිගම ආසනය නියෝජනය කලා 1973 වෙනකම්. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළා. එතුමා නොමිලයේ හාල් සේරුවක් ලබා දුන්නා. එදා කටයුතු කලාට මොකද වුනේ ඊළඟ වර මැතිවරණයේදී වැඩි ඡන්ද 1558යි. එච්චර දෙයක් කරපු කෙනෙකුට එහෙමයි වුනේ මේ ලංකාවේ. එහෙනම් එවැනි ආසනයක් තුළ මම ඉල්ලීමක් කරන්නේ තමුන්නාන්සේලාගෙන්. තමුන්නාන්සේලා සියලු දෙනාම මගේ හිතවත්තු ලෙස මම සළකනවා. සෑම කෙනෙක්ම සහෝදරත්වයෙන් මිත්‍රත්වයෙන් තමයි කටයුතු කරන්න ඕනේ. දේශපාලනය කියන එක කැල්ලක් විතරයි මේකේ. අද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පක්ෂ සංඛ්‍යාව 86ක්. මේ ගමන දැදිගම ආසනයේ තරග කරනවා ලියාපදිංචි පක්ෂ 8ක්. මේක මහා පුදුම ඡන්දයක් වෙලා තිබෙන්නේ කවදාවත් නෙවිච්චි පළාත් පාලන ආයතන තුළ තුන් හතර වතාවක් කාලය දීර්ඝ කරලා තිබෙනවා. ඒ වාගේම පළාත් පාලන මැතිවරණයක් පිළිබඳව දැඩිව උණුසුමක් තිබෙනවා මම කවදාවත් දැකලා නැහැ. නමුත් මේ දැඩි උණුසුම තුළ ඉතිරි වන්නේ සීතලක් කියන එක තමයි මට කියන්න සිද්ධ වන්නේ. මේ කාල සීමාවේ සභාපතිතුමාට වැඩියෙන්ම දොස්

අහන්නට ලැබෙන්නේ මේ ගොඩනැගිලි දෙක පිළිබඳවයි.අපි නගර ශාලාව දැන් කඩලා තිබෙනවා. එතුමා කෝටි හයක මුදලක් මේ සඳහා ඉතාම ඕනෑකමින් තමයි හොයා ගත්තේ. තුන් හතර වතාවක්ම ගිහිල්ලා තමයි මේ මුදල් හොයා ගත්තේ. නමුත් අවාසනාවකට වගේ ඒක කරන්න බැරි වුනා. මේ නිසා සමහරු කියනවා මේක කඩලා දැම්මා මේක හදන්නේ නැද්ද මුන් කියනවා. මම කියනවා මේක හදනවා, වෙලා තිබෙන්නේ මෙන්න මේකයි කියලා. එදා කෝටි හයයි. අද කෝටි දහයක් වෙන්න පුළුවන්. සුළු නගර සහා කාල සීමාවේදී නිර්මාණය කරලා තිබෙන මේ දේවල් වරකාපොල ප්‍රාදේශීය සභාවේ සරත් සුමනසූරිය සභාපතිතුමා ඉන්න කාලයේදී ඒක විනාශ කලා කියන කතාව පැතිරිලා යනවා. ඒ නිසා එතුමා ඇතුලු අපි සියළු දෙනාටම තිබෙනවා යම් වගකීමක්. මේක ඉදිරියට කරන්නේ කෙහොමද කියන එක හිතන්නට වෙනවා. නායකත්වය තමා හොද නරක දෙකම කරන්නේ. මගේ කිසිම අවස්ථාවකදී දේශපාලන පක්ෂයක් තිබුණට ඒ දේශපාලනය තුළ ස්ථාවරත්වයක් ගත්තේ ඩඩ්ලි සේනානායක මැතිතුමාගෙන් දේශපාලනයේ අයන්න කියලා අද වෙන විටත් මම ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ. මට ඒ දේ බය නැතුව කියන්න පුළුවන්. මං කරපු සියලු සංවර්ධන ක්‍රියාවන්ට දායකත්වය දුන්නේ එතුමා විශේෂයෙන් මතක් කරන්න ඕනේ මනෝ විජේරත්න මැතිතුමා. මනෝ විජේරත්න මැතිතුමා නැති නම් මම කවදාවත් ප්‍රාදේශීය සභාවට එන්නේ නැහැ. මොකද 1991 මාර්තු මාසයේ තිබුනා ප්‍රාථමික මැතිවරණයක් කියලා එකක්. ඔබතුමත් නැතුව ඇති මං හිතන්නේ.ඒ ප්‍රාථමික මැතිවරණය තිබ්බේ නීත්‍යානුකූලව නෙවෙයි පක්ෂයට අවශ්‍ය එකක්. ඒකෙන් බැලුවේ දැදිගම ආසනයේ ඉන්න ශාඛා සමිති යොවුන් සමිති. තරුණ සමිති වල ප්‍රධාන නිලධාරීන්ට පුළුවන් තමන් වැඩි කැමැත්තක් ඇති සමාජිකයින් සංඛ්‍යාවක් තෝරා ගන්නට. ඒක තෝරා ගත්තෙත් නගර ශාලාවේ. මං එතන හිටියේ එතුමාගේ ඉල්ලීම මත ගිහිල්ලා. මම තමයි එතන තේරීම්භාර දෙවෙනි නිළධාරියා. මම තමයි එදින ඡන්ද ගණන් කෙරුවේ. අවසාන ප්‍රතිඵලය දුන්නෙත් මමයි. මට ඡන්දය ඉල්ලන්න කිව්වා මම බෑම කිව්වා අවසානයේ කිව්වා බෑ මම ඔයාගේ නම දානවා කියලා. සිරිකොතට ඇවිල්ලා මේක අත්සන් කරන්න කියලා. සත පහක් වියදම් කරන්නේ නැතිව කිසිම සම්මුඛ පරීක්ෂණයකට නොගිහිල්ලා කිසිම ඉල්ලීමක් නොකර එදා ආරම්භ කරපු ප්‍රාදේශීය සභා මැතිවරණයේදි මම අනිවාර්යයෙන්ම පැමිණියා. නායකත්වය දුන්නා. අපි ඒ දේශපාලනය හදා ගත්තේ මිනිසුන් එක්ක ඉදලා. කෙසේ හෝ වේවා මේ තිබෙන ආසන 43 ක්‍රියාත්මක වන කොට අනිවාර්යයෙන්ම මෙතන ඉන්න සියලුම දෙනා ඒ ස්ථානයට එනවා නම් මම ඉතාමත් සංතෝෂයි. මම මේ සභාවේ නැති වුනත් එදාට ඇවිල්ලා ඔක්කෝටම කතා කරනවා. මම විශ්වාස කරනු ලබනවා ඔබ සතු වගකීම, ඔබ සතු යුතුකම මේ සියල්ලම ඉෂ්ට කරන්නේ ඔබට නොවෙයි, සමහරුන්ට මන්ත්‍රිවරු පෙන්නන්න බැහැ. ඒ නිසා තමන් ආරක්ෂා කර ගත යුතුව තිබෙන්නේ, තමන්ගේ ගෞරවය ආරක්ෂා කර යුතුව තිබෙන්නේ සැබෑ මහජන නියෝජිතවරයෙක් නියෝජිතවරියක් ලෙස ජනතාවට කරන සේවාවක් ලෙස කියලා මම මතක් කරන්නට ඕනේ. ඒ නිසා මේ කාල සීමාව තුළ අපේ අවසාන සභාව වෙන්නට ඉඩ තිබෙනවා. අප සියලු දෙනාම කටයුතු කරලා තිබෙන්නේ අපි වෙනුවෙන් නොවෙයි, ඔබ වෙනුවෙන් නොවෙයි මේ රටේ මහජනතාව වෙනුවෙන්. අද දවසේ විශේෂයෙන් මතක් කරන්නට ඕනේ රාජය අංශය කියන එක 60% කරන්නේ නැහැ කියන එක මම කියන්න ඕනේ. ඒ නිසා තමයි අපට මේ වගේ තත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.අද චොදනා එන්නේ මහජන නියෝජිතයාට උන් තමයි හම්බ කරන්නේ කියලා.කෙසේ හෝ වේවා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වරකාපොල ප්‍රාදේශීය සභාව යම් මට්ටමකට දැන් ඉහලට ගිහිල්ලා තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ හොඳම ප්‍රාදේශීය සභාව බවට පත් විමට හැකියාව ලැබේවාය කියා මම ප්‍රාර්ථනා කරනවා. ඔබ සැමට ස්තූතියි.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

මම ඉතාමත්ම සතුටු වෙනවා, මම කැමති නැහැ මේ සැසිවාරයේ අවසාන සභාව බවට පත් කරන්නට. ඒ නිසා අපි කතාව අඩු කරන්නට ඕනේ. අවසන් වෙන්න තිබුනේ අවුරුදු හතරෙන්. මේකත් දීර්ඝ කිරීමක්නේ.පනත අනුව තාම ඇමතිවරයාට බලය නැති වුනත් වෙනත් විකල්ප ක්‍රියාමාර්ග තිබෙනවා මේක ඉස්සරහට අරගෙන යන්න. අද රාත්‍රි කාලයේ හෙටත් අපි දැඩි උත්සාහයක් ගන්නේ මේ සභාවල ධූර කාල සමග ඉස්සරහට අරගෙන යන්නට. පැහැදිලිවම කරුණු කාරනා කිව්වා කොමසාරිස් පාලනයක් උඩ වැඩකරගෙන යන්නට අමාරුයි. ලේකම්වරුන්ගේවත් නිළධාරීන්ගේවත් දුර්වල කම් කියනවා නෙවෙයි මම මේ. විධායක බලය මහජන නියෝජිතවරයෙකුට ආව විට නිළධාරියෙක් හැසිරෙන ක්‍රමය හා මහජන නියෝජිතවරයෙක් නැතිවිට හැසිරෙන ක්‍රමය ක්‍රම දෙකක්. ඒ දෙක තේරුම් ගන්න ඕනේනේ. එහෙම අවශ්‍ය නිසානේ පළාත් පාලන ආයතන පිහිටුවලා තිබෙන්නේ. නැතිනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේ ටික කරන්න තිබුණනේ. ගම් සභා ක්‍රමය ගොඩාක් එහා ඉදන් තිබෙන දෙයක්. විශේෂයෙන්ම උපසභාපතිතුමා, විපක්ෂනායකතුමා කරුණාදාස ලෙනගල මන්ත්‍රිතුමා වාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රිවරු කිහිප දෙනයි මේ සභාව නියෝජනය කරන්නේ.

1991 පළාත් පාලන ආයතන නියෝජනය කරපු අය. සභාපතිවරු ගාණක් මාරු වෙලා ගිහිල්ලා. උප සභාපතිතුමයි, කරුණාදාස ලෙනගල මන්ත්‍රීතුමයි තමයි මේ සභාව නියෝජනය කලේ එදා ඉඳන්ම. අපි අලුත් අය.අපි එදා නිවාස කමිටුවෙන් ගොඩක් දේවල් කලා. මට එන චෝදනා දෙකම මම දන්නවා මේ කාරනා දෙකටම අංක 03/2022 දරණ මුදල් සීමා කිරීමේ චක්‍ර ලේඛනය එන්න පෙර මේ වැඩ ඔක්කොම අවසාන වෙලා තිබුනේ. කෝටි හය හමාරක් සම්පූර්ණ තෙමහල් ගොඩනැගිල්ලක් සති දෙකක් තුළ අනුමත කරගත්තා කියනවා නම් ඔබ දන්නවා මොන තරම් වෙහෙසක් කෝටි හය හමාර අනුමත කර ගන්නට මම ඔබත් එක්ක එකතු වෙලා කරාද කියන එක. සමහර ඒවා ඒ මොහොතේ කරන්න ඕනේ වුනා. ඔබ මට සහයෝගය දුන්නා. කඩන එක ඒ මොහොතේ කරන්න වුනා. විපක්ෂයක් කියලා හිතන්නේ නැතුව ඔබ මට සහයෝගය දුන්නා. ඒක නොකඩා අනුමත කර ගන්නම බැහැ. ඉඩමක් නැහැ, ප්‍රශ්නයක. නමුත් ඒවා නිත්‍යාණුකූලව අපි ඒ ටික කර ගත්තා. ඒවට පෙත්සම් ගහලා අපි ඒවට උත්තර දුන්නා.කෝටි හය හමාරක් අනුමත කර ගන්න කොහොම හරි මිනිට් එකක් ගහ ගත්තා ඇස්තමේන්තුගත මුදලින් පළමු අදියර සඳහා මුදල් අනුමත කර ගන්නට.ඔයාලට මතක ඇති උදයකාන්ත ගුණතිලක මන්ත්‍රීතුමාගේ කතාව මුල් ගල තියන දවසේ. රොෂාන් ඇමතිතුමත් කියනවා එදා මෙයා මාර කතාවක්නේ කළේ කියලා. එහෙම වුනා කියලා ඒවට නැවතුනෙත් නැහැ. නමුත් එදා ඒ ගෙනාපු කෝටි හය හමාරෙන් කෝටි දෙකක වැඩ අවසන් කලා. වැඩියෙන්ම වැඩ අවසන් කළේ අපි.කෝටි හය හමාරෙන් දෙකක වැඩ අවසන් කලා. ලංකාවෙම වැඩිම මුදල ලැබුණේ මට. ඒ ලැබුණ මුදලින් කෝටි දෙකක වැඩ අවසන් කළෙත් මම. අරගලයක ප්‍රතිඵල වල හැටියට අපට ඒ මුදල් පාලනය කරන්න වුණා.තවත් කෝටි පහ හමාරක සංශෝධිත ඇස්තමේන්තුවක් හදලා යවලා ඒ මුදල අනුමත වෙන මට්ටමේ දැන් තිබෙනවා. අඩක් නිම කරන ලද කර්මාන්ත සඳහා පළමුවෙන් මුදල් දෙනවා කියලා ආණ්ඩුව තීරණයක් ගත්තා. ඒ අනුව අපි හිටියා නැතා හෝ ඒ මුදල් ලැබෙනවා. ඒ නිසා පත්වන තත්වය අනුව පත්වන සභාපතිවරයෙක් යටතේ මේ වැඩ කරගන්නට පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ ඒ සල්ලි ටික තිබෙනවා. දෙවැනි කාරණය මේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අපි තීන්දු කළේ කී මනී ක්‍රමය මත. සභා තීන්දු අරගෙන සියල්ල කරලා සැළසුම් හදලා සැළසුම් අනුමත කරලා දේශීය ණය අරමුදලත් එක්ක සාකච්ඡා අවසන් කරලා තිබුනා. කෝටි දෙකක් අපි දේශීය ණය අරමුදලෙන් අරගෙන මුල් කොටස කරලා ඉන් පසු කී මනි මත යන්න අපි සියලුම සැළසුම් හදලා පත්තරයට දමන්න තිබෙන කොට තමයි අපට 03/2022 චක්‍රලේඛනය එන්නේ.දැන් මම මොනවද කරන්නේ. මට වැඩ කරන්න බැහැනේ එතකොට. රටේ සමස්ථ සංවර්ධන ක්‍රියාදාමය නවතින කොට වරකාපොල ප්‍රාදේශීය සභාවට විතරක් කරන්න බැහැනේ. ඒක හුදකලාව කරන්නට බැහැ. එහා පැත්තේ අතුරු මාර්ගයේ වැඩ නැවතිලා. දිගින් දිගටම ගරු අගමැතිතුමත් එක්ක කතා කලා එතුමා පලාත් පාලන විෂය භාර ඇමතිතුමා ලෙස. මම කිව්වා අඩක් නිම කරපු කර්මාන්ත ටිකවත් අවසන් කරගන්නට මුදල් දෙන්න කියලා. මගේ පුස්තකාලය නැහැ, නගර ශාලාව නැහැ. ජගත් සභාපතිතුමාගේ කෑගල්ල රංවල ජයතිලක පොඩි නිළමේ ඇමතිතුමාගේ කර්මාන්ත අමාත්‍යංශය තිබුණ ගොඩනැගිල්ල කඩලා දැම්මා එහා පැත්තේ තව ටිකකින් පාරට එනවා හේදිලා ගිහිල්ලා. මම සභා අරමුදලින් කර්මාන්තය නිම කරන්න අවසර ඉල්ලලා තිබෙනවා. යට කඩ කාමර ටික ටෙන්ඩර් දාලා ඒ මට්ටමින් යන්න. අපි ඉදිරියේදි උත්සාහ කරමු ගොඩක් දේවල් අපි කලා, සභාවක් ලෙස. ඒ දෙක විතරයි අපට ඉතුරු වුනේ. මේවා අවසන් කරන්න තව මාස 06 තිබුණොත් පුළුවන් ඉවර කර ගන්නට. මාස 06ක් දික් කරයි කියලා විශ්වාසය තිබෙනවා අපට. අපේ කාල සීමාව තුළ මේ දෙක අවසන් කළොත් ඉවරයි. අපිට ඒ දෙක විතරයි තිබෙන්නේ චෝදනා කරන්නට. මේ චෝදනා කරන්නෙත් වගකීමෙන් වැඩ කරපු අයනේ. ඒ අය මේක කලා නම්. අපට මේවා අහන්න වෙන්නේ නැහැනේ. තමන්ගේ කාලසීමාවේ වැඩ අවසන් කළා නම් චෝදනා කල අය අපට මේ චෝදනා අහන්න වෙන්නෙත් නැහැ. අපට වෙන වැඩක් කර ගන්න තිබුනා.එයාලා තමන්ගේ කොටස කරන්න ඕනේනේ. මේ සැසිවාරයේ මන්ත්‍රීවරුන්ගේ නම් තමයි අපි ගල් වල ගැහුවේ. මට පෙන්නන්නකො වෙන තියෙන තැනක් වත්. ඒ අපි වැඩ කරපු නිසානේ. මේ කාලය අපි වැඩි වැඩ කොටසක් කරපු කාලයක්. මං සතුටු වෙනවා. විපක්ෂනායකතුමා කිව්වා වගේ මම අත අරින කෙනෙක් නෙවෙයි. මගේ අවසාන බලාපොරොත්තුව පාර්ලිමේන්තු යන එක. වැඩක් නැහැනේ නැත්නම්. මම ඊළඟ මැතිවරණයේදී පාර්ලිමේන්තුවට ඉල්ලලා යනවාමයි. අත අරින්නේ නැමයි. ඒක අත අරින්නේ නැමයි. 2006 මට හීන සභාපති කියලා කට්ටිය හිනා වුනා. මිනිස්සුන්ට බලාපොරොත්තුවක් ඉලක්කයක් තිබෙන්නට ඕනේ යන්නට. එහෙම නැත්නම් යන්න බැහැ. මම පුටුවේ වාඩි වුනානේ. එහෙම නැතුව අනේ මට නම් බැහැ. මගේ ප්‍රමාණය මෙච්චරයි, මට මින් එහා යන්න බැහැ කිව්වොත් තමන්ට ඡන්දය දීපු මිනිස්සුන්ගේ බලාපොරොත්තු වලට පයින් ගැහුවා වෙනවා.ඒ මිනිස්සු ඡන්දය දෙන්නේ මේ මනුස්සයා උඩට දාන්න ඕනේ කියලා. ඒ වෙනුවෙන් තමයි වැඩ කරන්න ඕනේ. මේ සැසිවාරය තුළ අති විශාල  වැඩ කොටසක් අපි කලා. ඉදිරියේදි පාර්ලිමේන්තුවට යනවාමයි. දේශපාලඥයෙක් ලෙස ප්‍රාදේශීය සභාවට පත් වෙන්න උත්සාහ කරන අපේක්ෂකයාගේ ප්‍රාර්ථනය සභාවට යන්නට. සභාවට පත් වෙලා ඊළග සැසිවාරයේදී උප සභාපති වෙන්න

තමයි දහලන්නේ. සභාපති වෙච්ච මනුස්සයා දැන ගන්න ඕනේ පාර්ලිමේන්තුවට යන්නට හෝ පළාත් සභාවට යන්නට. ඒකට වැඩපිළිවෙළ හදා ගෙන යන්නට ඕනේ. මම වැඩ කළේ මිනිස්සුන්ට වැඩ කරන්න විතරක් නෙවෙයිනේ. මේ වැඩ තුළ මාව ශක්තිමත් නායකයෙක් ලෙස මේ ආසනයේ හැදෙයි කියන විශ්වාසය තුළ. ඒ අනුව මිනිස්සු මට පාර්ලිමේන්තු හෝ පළාත් සභා ඡන්දයක් දෙයි කියන විශ්වාසයෙන් මම වැඩ කලා. වැඩ කරලනේ ඡන්ද ගන්නට ඕනේ. වැඩ කළාටම ඡන්දය දුන්නේ නැතුවට වැඩ කරන්න ඕනේ. ඉදිරියේදී අපට වැඩ කරන්නට පුළුවන්.මම කියන්නේ මේ අය අතරින් සභාපති කෙනෙක් මෙම පුටුවේ වාඩි වෙන්න ඕනේ. විජයතුංග සභාපතිතුමාගෙන් පස්සේ මම මෙතන වාඩි වුණ නිසා නේ එතන ඉඳන් ඉස්සරහට අරගෙන ගියේ. අත්දැකීම් තිබෙන කෙනෙක්ම මෙතන වාඩි වෙන්නට ඕන එතකොට තමයි මෙතන කටයුතු අවසන් කරන්න පුළුවන් වෙන්නේ. ඉදිරියේ එන කෙනෙකුට බය නැතුව මෙතන වැඩ කරගෙන යන්න පුළුවන්. මගේ තාත්ත වගේ දේශපාලන ජීවිතේ පළාත් පාලන විෂයෙහි වැඩිම අවවාද දුන්නු කෙනා තමයි කරුණාදාස ලෙනගල ගරු ජොෂ්ඨ මන්ත්‍රී තුමා. ළමා උද්‍යානය ආරම්භ කරන වෙලාවේදී කරු අයියා මගෙන් අහනවා මොකක්ද මල්ලි මේ කරන්න යන්නේ, මට මන්ත්‍රීවරු කතා කරනවා මොකක්ද මේ අවුරුදු දහය දෙන්නෙ කියලා. මම දන්නවා මේ ගින්න පත්තු කරපු කෙනා. මම කිව්වා, අයියේ බය නැතුව ඉන්නකො කියලා විපක්ෂය කරුණු වාර්තා කරා විපක්ෂය පිළිගත්ත. පොඩි සරත් මන්ත්‍රීතුමත් අහනවා අපිට කිව්වා නම් අපි මේ ගැන අහන්නේ නැනේ කියලා. මට විපක්ෂය කියන්න ආණ්ඩු පක්ෂය බේරගෙන ඉන්න එපායැ කොහොම හරි. අවුරුදු දහයකට දුන්නනේ. කරගන්න අමාරු වුණා, ඒත් කරගත්තානේ හෙට අනිද්දට මේ ආසනයේ ඉන්න පොඩි ළමයි ටික නේ මේකේ සෙල්ලම් කරන්නේ. අපිට අභියෝග කරලා මේක නොකර හිටියා නම් මොකද වෙන්නේ 35% ක් සභා අරමුදලට මෙය බැර වෙනවා. ළමා උද්‍යානය තුළ සිදු වන සියලු ක්‍රියාකාරකම් වලින් ලැබෙන හැම රුපියල් සීයකින් 35% ක් එන්නේ සභා අරමුදලට මොකුත් වියදමක් කරන්න ඕන නෑ. අවුරුදු දහයක් මේ මුදල් එනවනේ ඔය ළමා උද්‍යානයට මේ සභාව දුවන්න බැරිද දවසක. ලක්ෂයක් ආදායමක් එනවා. බලන්නකෝ මට දැනෙන දේ දවසක මිනිස්සු එච්චර එයි කියලා හිතෙනවා. ලක්ෂ පනස් අටක් සභාවේ මාසෙකට ප්‍රතිපූර්ණය නොවන වැය. මේ මුදල් මම හොයලා තමයි ගෙව්වේ. කවදාවත් අහලා නැනේ මගේ මන්ත්‍රී මණ්ඩලය සභාපතිතුමා කොහොමද ඔය සල්ලි හොයන්නේ කියලා. ලක්ෂ 80 යි තිබුණේ ඩිපොසිට් කරලා. ලක්ෂ හැත්තෑ දෙකක් ණය තිබ්බා . ඔබතුමන්ලා මගෙන් ඇහුවේ නැති වුණාට ඔබතුමන්ලාගේ සහයෝගය තිබ්බා ඒ නිසා තමයි මේ වැඩ ටික කරගත්තේ. ආණ්ඩු පක්ෂ විපක්ෂ සියළු දෙනාම පොඩි පොඩි දේවල් මතවාදී ප්‍රශ්න අපි අතර තිබෙනවා, හැබැයි මම දැනං හිටියා යම් තීරණාත්මක වෙලාවක් මොනම කාරණයකට වත් මේ ආණ්ඩු පක්ෂයවත් විපක්ෂයවත් මාව දාලා යන්නේ නෑ ඒ ගැන විශ්වාසය මට තිබ්බා. හොඳම උදාහරණය තමයි අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මුහන්දිරම් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයත් එක්ක එළියට ගියපු එක ජොෂ්ඨ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් හැර ඒ වෙලාවේ විපක්ෂ නායක ෂරීප් මන්ත්‍රීතුමාට මේක දිගටම අරන් යන්න ඕන කියලා කතා කරපු විට එතුමන්ලා සභාව කරගෙන යන්නට මට සහයෝගය දුන්නා. එතුමාට එදා ඇවිල්ලා මේ පුටුවේ වාඩි වෙන්න තිබුනා. බහුතරය තිබ්බ යූ.එන්.පී එකට මගේ මන්ත්‍රීවරු හිටියේ නෑ මට සභාව කල් තියන්නත් බැහැ න්‍යාය පත්‍රයක් ඇරලා තිබ්බේ ප්‍රශ්න ගොඩක් මානසික පීඩනය කෙළවරක් නැහැ. සභාව අඩාලව කල් තිබ්බ නම් මට ඒක හොඳ නෑ. නමුත් න්‍යාය පත්‍රයේ සියලු දේවල් සම්මත කරගන්න මට විපක්ෂය උදව් කලා. එහෙම කාලසීමාවක තමයි මම ගත කළේ මිනිස්සුන්ට මරණය ගැන හිතාගෙන වැඩ කළොත් රට කරන්නට බැහැ. වැඩි කාලයක් ජීවත් වෙනවා කියලා හිතලා තමයි වැඩ කරන්නට ඕන. මම නම් එහෙම තමයි හදාගත්තේ අපට ආවේණික ක්‍රමයක් හදලා ඉදිරි පළාත් පාලන මැතිවරණය ආවා හෝ නාවා හෝ අද දවසේ දහලන්නේ ඡන්දයක් නැතිනම් ඉන්න සභාවල ධුර කාලය දීර්ඝ කර ගන්නට ඒකට අපි උත්සාහ කරනවා. ප්‍රධාන දේශපාලන පක්ෂයක පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකු අයින් කරලා නේ දෙන්නෙ. ඒ නිසා මම ඒකේ ඉන්න ඕන. හෙට දවසේ දේශපාලනය පොහොට්ටුවෙන් තමයි. අයින් වෙලා වෙනත් දේශපාලනයක් කරන්න අදහසක් නෑ. අනිත් තැන් අම්බලන් බවට පත්වෙලා මෙතන මගේ නිවස බවට පත්වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එන්නෙ 1994 මම 2002 ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් මම හැමදාම අතුරේ තමයි ගියේ ඔබතුමන්ලා ගත්ත තීරණය ගැන මම වරදක් කියන්නේ නෑ. මම ගලප්පත්ති මන්ත්‍රීතුමාගේ ගෙදරට ගිහින් කිව්වා අයියා මේක නං හරි යන්නෙ නැහැ කියල. පොඩ්ඩක් තව කල්පනා කරන්න කියලා. මම ශක්තිමත් දේශපාලන නායකයෙක් ලෙස බැසිල් ඇමතිතුමා පත් කරනවා. තුන් හතර වතාවක්ම ඩඩ්ලි සේනානායක මැතිතුමා මේ ආසනයේ අගමැති වෙච්ච ආසනය. ඒ ආසනය මං වගේ බිංදුවෙන් පටන් ගත්තු කෙනෙකුට ආසන සංවිධායක ධුරය දෙනවා නම් ප්‍රධාන දේශපාලන පක්ෂයක පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකුව අයින් කරලා නේ දෙන්නෙ. ඒ නිසා ඒ පක්ෂයේ ඉන්න ඕන හෙට දවස දේශපාලනය සමුහන්නේ පොහොට්ටුවෙන් තමයි. අයින් වෙලා යන්න වෙනකම් එක දේශපාලනයක් කරන්න අදහසක් නෑ. අනික ඒවා අම්බලන් බවට පත්වෙලා, මෙතන මගේ නිවස බවට පත්වුණා. දේශපාලන නිසා විශාල පතාක යෝධයන් පවා කඩා වැටුනා. ලලිත් ඇතුළත්මුදලි

මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා මේ රට කරන්න හිටපු නායකත්වය පෙනී පෙනී ජනාධිපතිකම අතේ තිබ්බව ගාමිණී දිසානායක මැතිතුමා ප්‍රතිපත්තිමය කාරණා මත බිඳ වැටෙනවා. මට හිමි වන දේ හෙට ඔබට හිමිවෙන්න පුළුවන්. මට අහිමි වන දේ හෙට ඔබට හිමි වන්නට පුළුවන්. මම මේ සැසිවාරය ආරම්භ කරපු දවසේ ඉඳන් විවිධ අභියෝග එල්ල වුණා මට සභාපතිකම් එපා වෙන තත්ත්වයට පත්වුණා. නමුත් ඒ හැම වෙලාවෙම ආණ්ඩු පක්ෂය හා විපක්ෂය මාව ආරක්ෂා කරපු නිසා ආරක්ෂා කිරීමේ ප්‍රතිඵල තමයි අද මේ තිබෙන්නේ. ඒ තරම් වැඩ කොටසක් කරන්නට අපට පුළුවන්කම ලැබුණේ ඔබ නිසයි විපක්ෂ නායක තුමාට චෝදනා කරනවා මට උදව් කරනවා කියලා. අපි අයියයි මල්ලි වගේ කියලා කියනවා. හෙට දවස මම සභාපති වෙලා මේ පුටුවේ වාඩි උනා එන සභාපතිවරයාට උදව් කරනවා මිසක් මම කකුලෙන් අදින්න යන්නේ නෑ. ඒක මට කරන්න බැහැ. විජයතුංග සභාපතිතුමා එක්ක මම මරා ගත්තත් වාහනයට ගහනවා. එදා සභාපති වුණා එයාව වැඩියෙන්ම ආරක්ෂා කළේ මම. මං සමහර අවස්ථාවල නීතිය මම දන්නේ නැහැ. නමුත් උප සභාපතිතුමා නීතිය දන්නවා එහෙත් උප සභාපතිතුමත් නිහඬ කරවා ගෙන එතුමාව ආරක්ෂා කළා. උපසභාපතිතුමාට ඒවා පෙන්වා දෙන්න අපි දෙන්නේ නැහැ. සභාව අතට අරගෙන සභාව අරගෙන යන්න 2006 දී අපි විජේතුංග සභාපතිතුමාට උදව් කළා. ලොකු දෙයක් බලාපොරොත්තු වෙන් නොවෙයි.අපේ තිබ්බා කණ්ඩායම් හැඟීම් හෙට දවසෙත් අපි මේක හදා ගන්නට ඕන මේක අපේ ආසනය. උප සභාපතිතුමාට පෞද්ගලිකව ගහන්න තමයි කුණු ටිකක් දැදිගමට අරන් ගියේ. එදත් මං ඒකට විරුද්ධ වුණා. වරකාපොල නගරයේ කුණු දැදිගමට අරන් යන්න එපා කියලා. එදත් මං විරුද්ධ වුණා පත්තරේ ලිපියකුත් ගියා. නමුත් මම මාස හයෙන් ඒක නැවැත්තුවා. අපි උප සභාපතිතුමාට ගරු කරනවා. උප සභාපතිතුමා මගේ හිතවතෙක් එක කියලා තියෙනවා සභාපතිවරුන් අතර නිදහසේ හිසේ කැක්කුමක් නැතුව වැඩ කළේ මේ සභාපතිමත් එක්ක කියලා මට ඒ වචනය හොඳටම ඇති, වෙන මොකවත් ඕනෙ නෑ එයාට හිමි තැන මෙතැන කවුරු මොනවා කීවත් මම ඒක බය නැතුව කියනවා ඕන තැනක. ජ්‍යෙෂ්ඨත්වය ගත්තත් උපසභාපතිතුමාට එවකට පැවති දේශපාලන වාතාවරනය අනුව දේශපාලනය කරන්න පුළුවන් පුද්ගලයෙක් හැටියට තමයි මම මේ තනතුරට පත් වුණේ. මම ඒ අභියෝගය බාර ගත්තා. මම ඒක ඉෂ්ට කළා. නමුත් මම උප සභාපතිතුමාට තිබෙන ගෞරවය නැති කරේ නැහැ මම.එතුමට කාමරයක් හදලා දුන්නා. ඕනම දෙයක් කරන්න එතුමාට මම අවස්ථාව සලස්වලා දුන්න. ගරු කිරීමේ ප්‍රතිඵල තමයි මේ තිබෙන්නේ. උප සභාපතිතුමා මගේ කකුලෙන් අදින්න ඕන තරම් කාරණා තිබුණා. එක දවසක්වත් එහෙම කරේ නෑ. ඒ ගැන මම සතුටු වෙනවා. සමහරු අපේ මන්ත්‍රීවරු එයාව පාවිච්චි කරන්න හැදුවත්, නමුත් එතුමා පාවිච්චි වුණේ නැහැ. එතුමාටත් ප්‍රශ්නයක් තිබෙන එක මානසික කාරණාවක් විපක්ෂනායකතුමත් එහෙමයි, මට උදව් කරනවා මම මේ අවස්ථාවේ පොඩි මතු කිරීමක් කළේ ඔබට හිමි තැන මම දෙන්න ඕන. ඒ නිසා අපි හෙට දවසේ මොකක් හරි ක්‍රමයකට කොමසාරිස් පාලනයට යන්න දෙන්නෙම නැතුව දැඩි උත්සාහයක් දරනවා කරන්න පුළුවන් උත්සාහයක් ගන්නවා. නීතිරීති හදාගෙන අගමැතිතුමා ළඟට ගියා ඒ නිසා මම හිතනවා යමක් සිදු වෙයි කියලා සිදු වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්. මමත් කවදාවත් යූ.එන්.පී එකට ඡන්දෙ දීපු කෙනෙක්වත් නෙවෙයි මගේ දේශපාලන ප්‍රතිපත්තිය ප්‍රතිවාදියා එක්සත් ජාතික පක්ෂය නමුත් අද සතුටු වෙන්නත් ඕන ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන දේශපාලන පක්ෂයක් ඉන්න අය අපි හැමෝම අද මේ ආරක්ෂා වෙලා ඉන්නේ ප්‍රචණ්ඩ වාදීන්ගෙන් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නිසා පිළිගන්නත් පුළුවන් නොපිළිගන්නත් පුළුවන් මම කියන්නේ මේ ඇත්ත විවෘත කාරණාව. අද මම දරුවො ටිකත් නිදහසේ ගෙදර ඉන්නේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නිසා. ඉදිරියේදී අපි එකතු වෙමු. එකතු වෙන්න කාලයක් ගනිමු. ආර්ථිකයත් ටිකක් බරපතල තත්ත්වයක තිබෙන්නේ. ලොකු කතාවක් නෙමෙයි කලේ පොඩි පොඩි දේවල් ටිකක් මතු බලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් වගේම නවක මන්ත්‍රීවරු විශාල අත්දැකීම් ප්‍රමාණයක් මේ පළාත් පාලන ආයතනය තුළින් ලබාගත්තා. ඒ අය තමයි ආයෙ පත්වෙන්න ඕනේ. ඉදිරියේදී දේශපාලන නායකයෙක් හැටියට මට කරන්න පුළුවන් ඉහළම දේ මම කරනවා. උදයකාන්ත ගුණතිලක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මේ සභාව නියෝජනය කරපු කෙනෙක්. දැන් තමයි මේ ආසනයේ මිනිස්සු සංවිධායකවරු බවට පත්වෙන්නේ. නැතිනම් හැමදාම ආනයනය කරපු සංවිධායකවරු හිටියේ පිටින් ගෙනත් දුන්නම එකෙකුටවත් ගොඩ එන්න දුන්නේ නැහැ. අපේ මේ හැකියාවට මේ තත්වයට ආවට සාමාන්‍යයෙන් මේවා දුන්නේ නැහැ. ඒව ගැනත් කල්පනා කරනවා මම ගොඩක් දේවල් මම දැන් වෙනස් කරගන්න උත්සාහ කරමින් තමයි ඉන්නේ. මම දැන් මං ගැනත් කල්පනා කරනවා. මගෙ පොඩි පුතා කියලා තිබ්බා අන්තිමට අපට අපි විතරයි ඉතුරු උනේ කියලා. අරගලය වේලාවේදී ඇතිවුණු ප්‍රශ්නයත් එක්ක ගෙදර පොඩි කට්ටිය කතා කරනකොට එයාලා කියනවා එයාලගේ යාළුවෝ පවා නැහැ කියලා. මේ දේශපාලනයේ තීරණාත්මක වෙලාවක ඉතිරි වෙන්නේ තමන් විතරයි. ඒක අපි තේරුම් අරන් ඉස්සරහට යන්න ඕනේ. අපිට ඡන්දයක් දෙන මිනිහෙක් පවා අපෙන් බලාපොරොත්තු වෙන්නේ යමක් කරගන්න අපිව ශක්තිමත් කරන්නට මහන්සි වෙන හැම කෙනෙක්ම උත්සාහ කරන්නේ එයාලගේ දේවල් කරගන්නට. අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමාගෙන් කොරියන් යන කෙනා ඊළඟ

පාර්ලිමේන්තු මැතිවරණයේ දී මහ ඇමතිතුමාට වැඩ කරනවා වාහන පර්මිට් එක ගන්න. ඒ මදිවට අතාවුද ඇමතිතුමාගේ පෝස්ට් එකත් ඉරලා කණගාටුවන කාරණා. අපි බිම ඉන්න අය හැටියට මේ ගැන කල්පනා කරන්න ඕන අපිට තමයි වැඩියම වදින්නේ. අපිට මිනිස්සුත් එක්ක ඉන්න පසුගිය කාලේ අපි පාරේ යනකොට කවුරුත් අපට කතා කළේ නැහැනේ. යකෙක් දැක්කා වගේ. අපි කරපු කිසිම දෙයක් නැහැ ඒවා දරන්න අපි පුළුවන් වෙන්න ඕන. දරා ගන්න පුළුවන් අයට තමයි හෙට දවස දරාගෙන ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. අපි ඔක්කොම එකතුවෙලා මේ ගමන යන්නට ඕන. අද දවස තුළ මේ සභාව සාර්ථක කරගැනීමට පැමිණි උප සභාපතිතුමා, විපක්ෂ නායකතුමා, මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා, ලේකම්තුමිය, විෂයභාර නිලධාරීතුමිය, මාධ්‍යවේදීන් සහ මගේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මාගේ ස්තූතිය පුද කරමින්, මම නැවත වරක් ඉල්ලනවා මේ සභාව විසුරුවා හැරියහොත් ලේකම්තුමියට උදව් කරන්න ඉතාමත් අපහසුවෙන් හදපු දේ විනාශ කරන්නට දෙන්නත් එපා. ලේකම්තුමිය දිහා බලන්න ඕනේ. එන්නට ඕනේ නිලධාරීන්ට උදව් කරන්නට ඕනේ කවුරු හරි කණ්ඩායමක් බලයට එනකං ආරක්ෂා කරලා දෙන්නට ඕන. ඒකට උදව් කරන්න කියා ඉල්ලීම් කරමින් සියලු දෙනාටම සුභ පතමින් ඉදිරි කාලය වාසනාවන්ත කාලයක් වෙන්න කියා ප්‍රාර්ථනා කරමින් අද දවසේ සභාවේ කටයුතු අවසන් කරනවා ස්තූතියි.

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව,

ලේකම්,
වරකාපොල ප්‍රාදේශීය සභාව,